# 1990 ආර්ථික ක්‍රියාකාරිත්වය, ගැටළු සහ ප්‍රතිපත්ති

1990 දී ශ්‍රී ලංකාවේ ආර්ථික ක්‍රියාකාරිත්වයෙහි කැපී පෙනුණු වැදගත් ලක්ෂණයන් වූයේ ආර්ථික වර්ධනය සැළකියයුතු ලෙස ඉහළ යාමත්, ගෙවුම් ශේෂය සැළකිය යුතු ලෙසින් යහපත් අතට හැරීමත්, රාජ්‍ය මූල්‍ය තත්ත්වය තවදුරටත් ශක්තිමත් වීමත්‍ය. මූර්ත දළ ජාතික නිෂ්පාදිතය (ද.ජා.නි.) සියයට 6.6 කින් වර්ධනය වී ඇතැයි ගණන් බලා ඇති අතර එය පුරා දශකයකදී වාර්තා වූ ඉහළම වර්ධන වේගය විය. ගෙවුම් ශේෂයෙහි වි.ගැ.හි. දශ ලක්ෂ 130 ක සමස්ත අතිරික්තයක් පැවති අතර, මෙය පස්වසරකට පසුව අතිරික්තයක් වාර්තා කළ ප්‍රථම වසර විය. අයවැය හිඟය, දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් වශයෙන් ගත් කල 1988 දී සියයට 15.7 සිට 1989 දී සියයට 11.2 දක්වා අඩු වූ අතර, 1990 දී එය තවදුරටත් සියයට 9.9 දක්වා පහත වැටිණි. කෙසේ වෙතත්, නොකඩවා අයහපත් වූ මූල්‍ය හා මිළ වර්ධනයන් වසර තුළ තවදුරටත් අවධානයට ලක් වූ ක්ෂේත්‍ර ලෙස පැවතිණි.

රට මුහුණ පෑ බාධාකාරී තත්ත්වයන්ට ප්‍රතිවිරුද්ධව, ආර්ථිකයට පහසුවෙන් ප්‍රකෘතිමත් වීමට ඇති ශක්තිය සහ නම්‍ය බව විදහා දක්වමින්, ශ්‍රී ලංකා ආර්ථිකය 1990 දී සීඝ්‍ර ආර්ථික පුනර්ජීවනයක් ලැබීය. 1989 දී දළ ජාතික නිෂ්පාදිතයේ සියයට 2.3 ක අසතුටුදායක වර්ධන වේගය හා සසඳන කල සියයට 6.6 ක් ලෙස ගණන් බලා ඇති මූර්ත දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනය වැදගත් ප්‍රගතියක් විය. මේ අතර, විදේශීය සාධක ආදායම අත්හැර ගණන් බලනු ලබන දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.) මූර්ත වශයෙන් සියයට 6.2 ක වර්ධනයක් වාර්තා කළ අතර ඉකුත් වසරේදී එම වර්ධන වේගය සියයට 2.3 ක් ව පැවතිණි. විදේශීය වත්කම් තත්ත්වයේ ඇතිවූ යහපත් වර්ධනයට අනුරූපව විදේශීය සාධක ආදායම් රට තුළට ගලා ඒම වැඩිවීම හේතුවෙන් 1990 වසරෙහි දී දළ දේශීය නිෂ්පාදිතයට වඩා දළ ජාතික නිෂ්පාදිතයෙහි වර්ධන වේගය වැඩිවිය.

**1 . 1 සංඛ්‍යා සටහන**


**ජාතික ආදයම සංඛ්‍යා 1988 – 1990**

| ශිර්ෂය | වටිනාකම (රුපියල් දශ ලක්ෂ) | | | වර්ධන අනුපාතිකය (සියයට) | |
|---|---|---|---|---|---|
| | 1988 | 1989* | 1990* | 1989* | 1990* |
| 1. පවත්නා සාධක වියදම් මිළ අනුව ද. දේ. නි. .. | 203,516 | 228,138 | 290,495 | 12·1 | 27·3 |
| 2. ස්ථාවර (1982) සාධක වියදම් මිළ අනුව ද. දේ. නි. .. | 119,050 | 121,729 | 129,256 | 2·3 | 6·2 |
| 3. පවත්නා සාධක වියදම් මිළ අනුව ද. ජා. නි. .. | 198,250 | 222,399 | 284,553 | 12·2 | 27·9 |
| 4. ස්ථාවර (1982) සාධක වියදම් මිළ අනුව ද. ජා. නි. .. | 116,214 | 118,874 | 126,747 | 2·3 | 6·6 |
| 5. මැදි වසර ජනගහණය ('000) .. | 16,586 | 16,806 | 16,993 | 1·3 | 1·1 |
| 6. ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය | | | | | |
| (i) පවත්නා මිළ අනුව (රුපියල්) .. | 11,952 | 13,293 | 16,745 | 11·2 | 26·0 |
| (ii) ස්ථාවර මිළ අනුව (රුපියල්) .. | 7,007 | 7,073 | 7,457 | 0·9 | 5·4 |

* තාවකාලික. මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

සාමාන්‍ය වාර්ෂික දළ ජාතික නිෂ්පාදන වර්ධන වේගය සියයට 2.7 ක් වූ ඉකුත් පස් වසරේ පැවති සාපේක්ෂ වශයෙන් අඩු වර්ධන ක්‍රියාකාරිත්වය සමඟ සළකා බලන කළ, 1990 වර්ධන ක්‍රියාකාරිත්වය ප්‍රශංසා කටයුතුය. මෙය, නිදහස් ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වාදීමත් සමගම 1978–1982 කාලච්ඡේදය තුළදී පැවති සියයට 6.0 ක වාර්ෂික සාමාන්‍ය වර්ධනයක් සහිත දළ ජාතික නිෂ්පාදිතයේ ඉහළ වර්ධන වේගය සිහිපත් කරන්නකි. නිවැරදි තත්ත්වයන් සහ යෝග්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මකව පවතින්නේ නම්, ආර්ථිකයෙහි ශක්තිය හා වර්ධන ශක්‍යතාවය කෙබඳු දැයි මෙයින් පිළිබිඹු වේ.

# දළ ජාතික නිෂ්පාදිතය




ශ්‍රී ලංකා මහ බැංකුව.

පසුගිය වසරට වඩා සියයට 27.9 ක වර්ධනයක් පිළිබිඹු කරමින් 1990 දී දළ ජාතික නිෂ්පාදිතය පවත්නා සාධක වියදම් මිළ අනුව රුපියල් බිලියන 285 ක් වී යැයි ගණන් බලා ඇත. ආර්ථිකයේ සමස්ත මිළ වෙනස්වීම් මැනීම සඳහා භාවිතා කරනු ලබන දළ ජාතික නිෂ්පාදිත අවධමනකය, 1989 වාර්තා වූ සියයට 9.7 ක වේගයට වඩා සැළකිය යුතු ලෙස වැඩිවෙමින්, 1990 දී සියයට 20 කින් ඉහළ නැගිණි. මේ අනුව දළ ජාතික නිෂ්පාදිතය (1982) ස්ථාවර මිළ ගණන් අනුව සියයට 6.6 ක වර්ධනයක් පෙන්වමින් රුපියල් බිලියන 127 ක් ලෙස ගණන් බලන ලද අතර, එය පුරා දශකයක් තුළ වාර්තා වූ වැඩිම වර්ධන වේගය විය.

රෙජිස්ට්‍රාර් ජෙනරාල් වරයාගේ තාවකාලික ඇස්තමේන්තුවලට අනුව, 1990 දී ශ්‍රී ලංකාවේ වසර මැද ජනගහනය දශ ලක්ෂ 17 දක්වා, 1989 ට වඩා සියයට 1.1 කින් වැඩි විය. මේ අනුව 1990 දී පවත්නා මිළ ගණන් අනුව ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය රුපියල් 16,745 (ඇ.එ.ජ. ඩොලර් 418) ක් වී යැයි ඇස්තමේන්තු කර ඇත. පවත්නා මිළ ගණන් අනුව ඒක පුද්ගල ආදායම සියයට 26 කින් වැඩි වූ අතර, මූර්ත වශයෙන් සළකා බලන කල වැඩිවීම සියයට 5.4 ක් විය.

දේශීය ඉතිරි කිරීම් 1989 දී රුපියල් බිලියන 30.8 සිට 1990 දී රුපියල් බිලියන 47.4 දක්වා වැඩි වී යැයි ඇස්තමේන්තු කර ඇත. මේ අනුව, දේශීය ඉතිරි කිරීම් දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් වශයෙන් සියයට 12.2 සිට සියයට 14.8 දක්වා ඉහළ නැගිණි. මේ අතර, විදේශීය ප්‍රේෂණයන් සහ විදේශීය ශුද්ධ සාධක ආදායම් ද ඇතුළත් වූ ජාතික ඉතිරි කිරීම්, දළ ජාතික නිෂ්පාදිතයේ අනුපාතිකයක් ලෙස දෙවසර තුළදී සියයට 14.6 සිට සියයට 17.5 දක්වා වැඩිවී ඇත. ආර්ථිකයේ දැඩි උද්ධමනකාරී පීඩනයන් පවත්නා අවධියකදී, සුළු ප්‍රමාණයකින් වුවද ඉතුරුම් අනුපාතිකයේ වූ මෙම වැඩිවීම ධෛර්ය එලවන සුළු වර්ධනයක් ලෙස සැළකිය හැකිය.

**1 . 2 සංඛ්‍යා සටහන**

**දළ ජාතික නිෂ්පාදිතයේ සංයුතිය සහ වර්ධනය 1988 - 1990**

**ස්ථාවර (1982) සාධක වියදම් මිළ අනුව**

| අංශ | වටිනාකම රු. දශ ලක්ෂ | | | වර්ධන අනුපාතිකය | | |
|---|---|---|---|---|---|---|
| | 1988 | 1989* | 1990* | 1988 | 1989* | 1990* |
| 1. කෘෂිකර්මය, වන හා ධීවර .. | 27,984 | 27,666 | 30,100 | 2·1 | - 1·1 | 8·8 |
| 1·1 තේ .. | 2,926 | 2,668 | 3,004 | 6·4 | - 8·9 | 12·6 |
| 1·2 රබර් .. | 770 | 697 | 718 | 0·7 | - 9·5 | 3·0 |
| 1·3 පොල් .. | 2,501 | 3,210 | 3,261 | - 15·7 | 28·3 | 1·6 |
| 1·4 වී .. | 6,312 | 5,258 | 6,467 | 16·4 | - 16·7 | 23·0 |
| 1·5 අනෙකුත් (අතුරු භෝග වන හා ධීවර ඇතුළු) .. | 15,475 | 15,833 | 16,650 | - 0·2 | 2·3 | 5·2 |
| 2. පතල් සහ කැනීම් .. | 3,392 | 3,576 | 3,901 | 9·0 | 5·4 | 9·1 |
| 3. නිමැවුම් කර්මාන්ත .. | 19,622 | 20,488 | 22,427 | 4·7 | 4·4 | 9·4 |
| 3·1 වෘක්ෂ භෝග සැකසීම .. | 3,273 | 3,257 | 3,530 | - 2·0 | - 0·5 | 8·4 |
| 3·2 අනෙකුත් .. | 16,349 | 17,231 | 18,897 | 6·1 | 5·4 | 9·7 |
| 4. තැනීම් .. | 8,463 | 8,514 | 8,684 | 1·5 | 0·6 | 2·0 |
| 5. සේවා .. | 59,589 | 61,485 | 64,144 | 2·2 | 3·2 | 4·3 |
| 6. ද. දේ. නි. .. | 119,050 | 121,729 | 129,256 | 2·7 | 2·3 | 6·2 |
| 7. විදේශීය ශුද්ධ සාධක ආදායම .. | - 2,836 | - 2,855 | - 2,509 | — | — | — |
| 8. ද. ජා. නි. .. | 116,214 | 118,874 | 126,747 | 2·6 | 2·3 | 6·6 |

* තාවකාලික — මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

ආර්ථිකයේ අනාගත වර්ධන අපේක්ෂාවන් යහපත් කරමින් ප්‍රාග්ධන සම්පාදන අනුපාතිකය 1990 දී සැළකිය යුතු ලෙසින් වැඩිවිය. තොග වෙනස්වීම් ද ඇතුළත්ව දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය (ද.දේ.ප්‍රා.ස.) 1989 දී සියයට 8 කින් පමණක් වර්ධනය වූ අතර 1990 දී සියයට 33 ක වැඩිවීමක් වාර්තා කළේය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය

වෙළෙඳ මිළ අනුව දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස 1989 දී සියයට 21.7 සිට 1990 දී සියයට 22.6 දක්වා ඉහළ නැගිණි. ඉකුත් වසරේදී පැවති රටාවට සමානව යමින් ප්‍රාග්ධන සම්පාදනය සඳහා වැඩි දායකත්වයක් ලැබුනේ පෞද්ගලික අංශයෙනි. පෞද්ගලික අංශයෙහි සහ රාජ්‍ය අංශයෙහි ඒකාබද්ධ ප්‍රාග්ධන සම්පාදනය 1989 වසරේදී පැවති සියයට 16 ක වැඩිවීම හා සසඳන කල සියයට 32 කින් ඉහළ නැගිණි. මීට ප්‍රතිවිරුද්ධ වශයෙන්, රාජ්‍ය අංශයේ දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය පසුගිය වසරේදී පැවති සියයට 15 ක අඩුවීමට සමාන රටාවක් අනුගමනය කරමින් සියයට 5 ක අඩුවීමක් වාර්තා කරනු ලැබීය.

1990 දී ආර්ථික වර්ධනය වේගවත් කරනු ලැබූ ප්‍රධාන සාධකය වූයේ කෘෂිකර්ම අංශයේ විශිෂ්ට ක්‍රියාකාරිත්වයයි. වන සහ ධීවර කර්මාන්තයද ඇතුළත් කෘෂිකර්ම අංශයේ එකතු කළ අගය, ඉකුත් වර්ෂයේදී වූ සියයට 1.1 ක පහත වැටීමට ප්‍රතිවිරුද්ධව, සියයට 8.8 ක සිත් ඇදගන්නා සුළු වර්ධන වේගයක් වාර්තා කරනු ලැබිණි. කෘෂිකර්ම අංශය ඇතුළත, වර්ධන ක්‍රියාකාරිත්වයෙහි මිශ්‍ර ප්‍රතිඵල දක්නට ලැබිණි. වැවිලි භෝග අතර, තේ උප අංශයෙහි ක්‍රියාකාරීත්වය වඩාත්ම සිත් ඇදගන්නා සුළු විය. 1990 තේ නිෂ්පාදනය, මෙතෙක් වාර්තාගත ඉහළම නිෂ්පාදන මට්ටම වූ අතර, එය කෘෂිකර්ම අංශයේ එකතු කළ අගය මූර්ත වශයෙන් සියයට 12.6 කින් ඉහළ නැංවීමට සමත් විය. මේ අතර, රබර් සහ පොල් උප අංශයන්හි එකතු කළ අගය 1990 දී පිළිවෙලින් සියයට 3 කින් සහ සියයට 1.6 කින් ඉහළ නැගිණි. 1989 දී පැවති පහත් මට්ටමට වඩා සියයට 23 ක වැඩිවීමක් වාර්තා කළ වී නිෂ්පාදනය, 1990 දී විශාලතම පිබිදීමක් දක්නට ලැබුණු භෝග වගාව විය. වී නිෂ්පාදනය කරනු ලබන දිස්ත්‍රික්කයන්හි පැවති යහපත් කාළගුණික තත්ත්වය, නිෂ්පාදන වර්ධන වේගය වැඩිකිරීමෙහිලා ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර 1990 දී වන සහ ධීවර කර්මාන්ත ඇතුළත් අනෙකුත් කෘෂිකර්ම උප අංශයේ එකතු කළ අගය ප්‍රශංසනීය ලෙස සියයට 5.2 කින් වර්ධනය විය. ඉකුත් වර්ෂයේ දී මෙම වර්ධනය සියයට 2 ක් පමණක් විය. සමස්තයක් වශයෙන් ගත් කල, මුළු දළ දේශීය නිෂ්පාදිතයට කෘෂිකර්ම අංශයෙන් වන ඉහළ බර තැබුම් ප්‍රමාණය නිසා, මෙම අංශයේ සිත් ඇදගන්නා සුළු ක්‍රියාකාරිත්වය 1990 දී ආර්ථිකයේ සමස්ත වර්ධනය ඉහළ නැංවීමට විශාල වශයෙන් හේතු විය.

1990 දී යහපත් ක්‍රියාකාරිත්වයක් දක්නට ලැබුණු තවත් අංශයක් වූයේ පතල් හා කැණීම් අංශයයි. මෙම අංශයෙහි එකතු කළ අගය සියයට 9.1 කින් වැඩිවිණි. මෙම අංශය තුළ මැණික් ගැරීම් හා කැණීම් උප අංශයට අදාළ කටයුතු ප්‍රසාරනය වූ අතර, උතුරු සහ නැගෙනහිර පළාත්වල යළිත් පැන නැගුණු අභ්‍යන්තරික නොසන්සුන්තාවයන් හේතුවෙන් ඉල්මනයිට්, රූටයිල් සහ අනෙකුත් ඛනිජ වැලි නිෂ්පාදනය පහත වැටිණි.

මෑත වර්ෂයන්හිදී දක්නට ලැබුණු සාමාන්‍ය රටාවට අනුරූපව, නිමැවුම් කර්මාන්ත අංශය 1990 දී ආර්ථිකයේ පැවති වේගවත් වර්ධන ප්‍රවනතා පවත්වා ගැනීමට විශාල දායකත්වයක් සපයනු ලැබිණි. කෘෂිකාර්මික භෝග සැකසුම්, කම්හල් කර්මාන්ත සහ කුඩා කර්මාන්ත ආදිය ප්‍රධාන වශයෙන් දායකත්වය සපයනු ලැබූ නිමැවුම් කර්මාන්ත අංශයෙහි එකතු කළ අගය 1990 දී සියයට 9.4 කින් සිත් ඇදගන්නා ලෙස වර්ධනය විය. නිමැවුම් කර්මාන්ත අංශයේ මුළු නිෂ්පාදනයෙන් තුනෙන් දෙකක ප්‍රමාණයකට හිමිකම් පෑ කම්හල් කර්මාන්ත උප අංශයෙහි නිමැවුම, මූර්ත වශයෙන් සියයට 10.2 කින් ඉහළ නැගිණි. ඛනිජ තෙල් නිෂ්පාදිත නිමැවුම අත්හල විට, මෙම වර්ධනයෙන් විශාල ප්‍රමාණයක් පෞද්ගලික අංශය තුළින් ලද අතර, ආර්ථික දිරිගැන්වීම් සඳහා ප්‍රතිචාර දැක්වීමේදී පෞද්ගලික අංශය දක්වන ක්‍රියාශීලීත්වය එයින් විදහා දැක්වුණි. 1990 දී දියුණු ක්‍රියාකාරිත්වයක් පෙන්වූ කාර්මික කාණ්ඩ වූයේ රෙදිපිළි, ඇඳුම් පැළඳුම් හා සම් නිෂ්පාදිත, රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල් හා ප්ලාස්ටික් නිෂ්පාදිත සහ සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර හා ප්‍රවාහන උපකරණ යන කාර්මික අංශයන්ය. මේ අතර තේ, පොල්, රබර් හා පොල් මද ආශ්‍රිත නිෂ්පාදන සැකසුම් වෙතින් වූ එකතු කළ අගය, සියයට 8.4 ක

ප්‍රශංසා කටයුතු වර්ධනයක් වාර්තා කරනු ලැබූ අතර, එය 1989 දී දක්නට ලැබුණු සියයට 0.5 ක අඩුවීමට ප්‍රතිවිරුද්ධ තත්ත්වයකි. වසර තුළදී තේ නිෂ්පාදන පරිමාව ඉහළ යාම මෙම වැඩිවීමට ප්‍රධාන හේතුව විය.

1990 වසරේ වර්ධන ක්‍රියාකාරිත්වයට දායකත්වය සැපයූ අනෙකුත් අංශ අතර සේවා අංශයද විය. 1989 දී සියයට 3.2 කින් වර්ධනය වූ සේවා අංශය 1990 දී සියයට 4.3 ක ඉහළ වර්ධන වේගයක් වාර්තා කරනු ලැබිණි. මුළු දළ ජාතික නිෂ්පාදනයට මෙම අංශයෙහි ඇති ඉහළ බරතැබුම් ප්‍රමාණය නිසා, වසර තුළ මුළු දළ ජාතික නිෂ්පාදිතයෙහි වර්ධනයෙන් සියයට 34 කට මෙම අංශයෙහි ප්‍රසාරණය වීම හිමිකම් පානු ලැබින. සේවා අංශය තුළ විදුලිය, ගෑස්, ජලය සහ සනීපාරක්ෂක සේවාවන්හි එකතු කළ අගය සියයට 10.2 කින් වැඩි විය. මේ අතර, ආර්ථික ක්‍රියාකාරිත්වය උසස් මට්ටමක පැවතීම නිසා වෙළෙඳ හා ප්‍රවාහන සේවා අංශය සහ බැංකු හා මූල්‍ය සේවා අංශයන්ට ඉහළ වර්ධන වේගයක් අත්කර ගැනීමට හැකිවිය. දිගු කලක සිට අපේක්ෂා කළ සංචාරක කර්මාන්තයෙහි ඇති වූ ප්‍රගතිය හේතු කොටගෙන හෝටල් සේවා අංශයෙහි එකතු කළ අගය මූර්ත වශයෙන් සියයට 20 කින් ඉහළ නැගිණි.


1989 දී දුඩි පසුබෑමකට ලක් වූ කෘෂිකර්ම අංශය, 1990 දී විශිෂ්ට ප්‍රගතියක් ලැබීය. යහපත් කාලගුණික තත්ත්වයන්, ආකර්ෂණීය මිල ගණන් සහ දිවයිනේ බොහෝ පළාත් තුළ අභ්‍යන්තරික නොසන්සුන්තා සමනය වීම යන කරුණු කෘෂිකර්ම අංශය ප්‍රකෘතිමත් වීමට දායක වූ සාධක අතර විය. මෙම වර්ධනයට සියළුම භෝග අංශයන් දායක වූ අතර, විශේෂයෙන් තේ, වී සහ සුළු ආහාර භෝග අංශ විශිෂ්ට ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කරනු ලැබිණි.

1990 දී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 233 ක් වූ තේ නිෂ්පාදනය, මෙතෙක් අත්කර ගත හැකිවූ ඉහළම නිෂ්පාදන මට්ටම විය. පසුගිය වසර හා සසඳන කළ මෙය සියයට 13 ක වැඩිවීමකි. උන්නතාංශ බිම් කාණ්ඩ තුනම මෙම යහපත් ක්‍රියාකාරිත්වයට දායක විය. කෙසේ වෙතත්, වැඩිම දායකත්වය පහත් බිම් තේ වලින් ලද අතර එහි නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 105 දක්වා සියයට 27 කින් වැඩි විය. මෙම කාණ්ඩය තුළ මෙතෙක් වාර්තාගත වූ ඉහළම නිෂ්පාදන මට්ටම මෙය විය. උස් බිම් හා මැදි බිම් තේ නිෂ්පාදනය පිළිවෙලින් සියයට 3 කින් හා සියයට 4 කින් වැඩි විය. යහපත් කාලගුණික තත්ත්වය, සිත් ඇදගන්නා සුළු මිල ගණන් සහ දිවයිනේ බොහෝ පළාත්වල අභ්‍යන්තරික නොසන්සුන්තාවයන් සමනය වීම තේ අංශයෙහි ඇතිවූ මෙම විශිෂ්ට ප්‍රගතියට විශේෂයෙන්ම හේතු සාධක විය.

1990 වසරේ තේ නිෂ්පාදනයේ ඇතිවූ වර්ධනයෙන් විශාලතම කොටසට දායක වූයේ පෞද්ගලික අංශයයි. ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙහි (ජනවසම) සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙහි (ශ්‍රී.ලං.රා.වැ.ස.) ඒකාබද්ධ නිෂ්පාදනය (අමු තේ දළු මිළදී ගෙන කරනු ලැබූ නිෂ්පාදනද ඇතුලත්ව) වැඩිවූයේ කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 139 දක්වා සියයට 5 කින් පමණකි. මේ හා අනුරූපව, මුළු තේ නිෂ්පාදනයෙන් මෙම සංස්ථාවනට අදාළ සාපේක්ෂ කොටස 1989 දී සියයට 64 සිට 1990 දී සියයට 60 දක්වා පහත වැටිණි. ජනතා වතු සංවර්ධන මණ්ඩල මගින් පාලනය කරනු ලබන වතුවල තේ නිෂ්පාදනය, සියයට 4 කින් වැඩිවී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 72 ක් වූ අතර, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙහි තේ නිෂ්පාදනය, සියයට 5 කින් වැඩි වී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 67 ක් විය. මේ අතර, පෞද්ගලික අංශයෙහි තේ නිෂ්පාදනය 1990 දී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 94 දක්වා සියයට 27 ක සැළකිය යුතු වැඩිවීමක් වාර්තා කළේය. රාජ්‍ය සංස්ථාවන්හි නිමැවුම් කම්හල්වල සැකසූ, එහෙත් පෞද්ගලික අංශය විසින් නිපදවනු ලැබූ අමු තේ දළුද ඇතුළත් කළ විට, මුළු තේ නිෂ්පාදනයෙහි පෞද්ගලික අංශයට හිමි කොටස සියයට 44 සිට සියයට 49 දක්වා ඉහළ නැගිණි.

# කාර්මික සම්භවය අනුව දළ ජාතික නිෂ්පාදිතය

ස්ථාවර (1982) සාධක වියදම් මිළ අනුව




ශ්‍රී ලංකා මහ බැංකුව.

කොළඹ තේ වෙන්දේසියේ දී විකුණන ලද තේ ප්‍රමාණය 1989 දී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 193.7 හා සසඳන කල, 1990 දී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 216.9 දක්වා සියයට 12 කින් වැඩි විය. ඉකුත් වසරේදී මෙන්ම, 1990 වසර තුළදීද පහත වැටුණු ලෝක තේ සැපයුම සමග ඉහළ ගිය ඉල්ලුම, කොළඹ වෙන්දේසියේ තේ මිළ ගණන් ඉහළ නංවාලීමට හේතු විණි. කොළඹ වෙන්දේසියේ දී සියළුම තේ සඳහා වූ සාමාන්‍ය දළ මිළ 1989 දී කිලෝග්‍රෑමයකට රුපියල් 54.61 සිට 1990 දී කිලෝග්‍රෑමයකට රුපියල් 70.97 දක්වා සියයට 30 ක සැළකිය යුතු වැඩිවීමක් වාර්තා කරනු ලැබිණි. 1990 දී තේ සඳහා වූ සාමාන්‍ය අපනයන මිළ ද (නැ.වි.ස.) සියයට 37 කින් වැඩි වී කිලෝග්‍රෑමයකට රුපියල් 91.78 ක් විය.

ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙහි සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය (නි.පි.) 1989 දී කිලෝ ග්‍රෑමයකට රුපියල් 52.68 සිට 1990 දී කිලෝග්‍රෑමයකට රුපියල් 57.87 දක්වා වැඩි වුනු අතර, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙහි පිරිවැය, කිලෝග්‍රෑමයකට රුපියල් 54.03 සිට කිලෝග්‍රෑමයකට රුපියල් 61.89 දක්වා ඉහළ නැගිණි. මේ අතර, සමස්තයක් වශයෙන් ගත් කල මෙම අංශයට අදාළ සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය 1989 දී කිලෝග්‍රෑමයකට රුපියල් 49.70 සිට 1990 දී කිලෝ ග්‍රෑමයකට රුපියල් 57.65 දක්වා වැඩි වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත. අධික පොහොර මිළ සහ ඉහළ වැටුප් වියදම මෙම වැඩිවීමට විශාල වශයෙන් හේතු විය.

1990 දී රබර් නිෂ්පාදනය, සියයට 3 කින් වැඩිවී කිලෝග්‍රෑම් දශ ලක්ෂ 114 ක් වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත. කිරි කපන ලද රබර් බිම් ප්‍රමාණයේ වූ සුළු අඩුවීමක් හා සළකන කල මෙම වැඩිවීමට මුළුමනින්ම හේතු වූයේ වසර තුළ උසස් සාමාන්‍ය ඵලදාවක් ලබා ගැනීමය. යහපත් කාලගුණික තත්ත්වය නිසා කිරි කපනු ලැබූ දින ගණන ඉහළ යාම සහ අභ්‍යන්තරික නොසන්සුන්තාවයන් සමනය වීම, මෙම යහපත් තත්ත්වයට තුඩු දුන් සාධක අතර විය. නිෂ්පාදනයෙහි වූ මෙම වැඩිවීමට මුළුමනින්ම දායක වූයේ, මුළු රබර් නිෂ්පාදනයෙන් සියයට 34 කට හිමිකම් පෑ ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවයි. මේ අතර, වසර තුළදී පෞද්ගලික අංශයේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් දශ ලක්ෂ 75 දක්වා සියයට 2 කින් අඩුවිය.

ප්‍රධාන වශයෙන්ම, පොහොර මිළ හා රසායන ද්‍රව්‍ය මිළ වැඩිවීම හා ඉහළ වැටුප් වියදම හේතු කොටගෙන පෞද්ගලික අංශයේ මෙන්ම රාජ්‍ය අංශයේද රබර් නිෂ්පාදන පිරිවැය වසර තුළදී ඉහළ නැගිණි. පෞද්ගලික අංශයේ නිෂ්පාදන පිරිවැය 1989 දී කිලෝග්‍රෑමයකට රුපියල් 15.06 සිට 1990 දී කිලෝග්‍රෑමයකට රුපියල් 17.96 දක්වා සියයට 19 කින් ඉහළ නැග ඇතැයි ගණන් බලා ඇත.

පසුගිය වසරේදී මෙන්ම, 1990 වසරේදීද, ජාත්‍යන්තර වෙළෙඳපොලෙහි රබර් මිළ ගණන්වල සතුටුදායක වර්ධනයක් දක්නට නොලැබුණි. ප්‍රධාන රබර් පරිභෝජන රටවල් වෙතින් වූ අඩු ඉල්ලුම සහ ඉහළ ගිය ලෝක රබර් සැපයුම, රබර් මිළ පහත හෙළීමට හේතු විණි. 1990 දී කොළඹ වෙන්දේසියේ ආර්.ඇස්.ඇස්.නො. 1 හි සාමාන්‍ය මිළ කිලෝග්‍රෑමයකට රුපියල් 22.63 සිට කිලෝග්‍රෑමයකට රුපියල් 22.93 දක්වා ඉතා සුළු වශයෙන් වැඩි විය. මීට ප්‍රතිවිරුද්ධව, ආර්.ඇස්.ඇස්. නො. 2 සහ ලේටෙක්ස් ක්‍රෙප් IX හි සාමාන්‍ය මිළ පසුගිය වසරේ මිළ ගණන්වලට වඩා සුළු වශයෙන් අඩු වූ අතර, ඒවා පිළිවෙලින් කිලෝග්‍රෑමයකට රුපියල් 21.36 සහ රුපියල් 28.88 ක් විය. සියළුම වර්ගවල රබර් සඳහා වූ සාමාන්‍ය අපනයන මිළ (නැ.වි.ස.) සියයට 2 කින් අඩුවී 1990 දී කිලෝග්‍රෑමයකට රුපියල් 35.50 ක් විය.

1989 දී සියයට 28 කින් ඉහළ ගිය පොල් නිෂ්පාදනය, 1990 දී ගෙඩි දශ ලක්ෂ 2,523 දක්වා සියයට 2 ක සුළු වැඩිවීමක් වාර්තා කළේය. පොල් අංශයෙහි පැවති මෙම බලාපොරොත්තු කඩකරවන සුළු ක්‍රියාකාරිත්වයට මූලික වශයෙන් හේතු වූයේ වසර තුළදී පොල් ත්‍රිකෝණයෙහි උතුරු කොටස දැඩි නියඟ තත්ත්වයකට ගොදුරු වීමය.

1989 දී දෙගුණයකටත් වඩා වැඩි ප්‍රමාණයකින් ඉහළ ගිය කපාපු පොල් නිෂ්පාදනය, 1990 දී යළි සියයට 17 කින් වර්ධනය විණි. මෙයට ප්‍රධාන හේතුව වූයේ ශ්‍රී ලංකාවේ කපාපු පොල් සඳහා ඉහළ ජාත්‍යන්තර ඉල්ලුමක් පැවතීමයි. මීට ප්‍රතිවිරුද්ධව, 1989 දී විශාල වශයෙන් වැඩිවුනු පොල් මද ආශ්‍රිත අනිත් ප්‍රධාන නිෂ්පාදන දෙවර්ගය 1990 දී බෙහෙවින් අසතුටුදායක ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කරනු ලැබිණි. පොල් තෙල් නිෂ්පාදනය සුළු වශයෙන් පමණක් ඉහළ ගිය අතර, කොප්පරා අපනයන ප්‍රමාණය ගෙඩිවලට සම කර බැලූ විට සියයට 24 කින් අඩු වී ගෙඩි දශ ලක්ෂ 31 ක් විය. කපාපු පොල්වලට ලැබුණු ඉහළ මිළ ගණන් හේතුවෙන් ප්‍රධාන පොල් මද ආශ්‍රිත නිෂ්පාදන වර්ග තුනේම සාමාන්‍ය අපනයන මිළ (නැ.වි.ස.) ගෙඩියකට රුපියල් 3.63 දක්වා සියයට 8 කින් වැඩිවිය. මේ අතර, 1989 දී ගෙඩියකට රුපියල් 0.85 ක් වූ සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය 1990 දී ගෙඩියකට රුපියල් 1.11 දක්වා සියයට 31 ක සැළකිය යුතු වැඩිවීමක් වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත. මෙම වැඩිවීම අධික පොහොර මිළ සහ ඉහළ වැටුප් පිරිවැයෙහි ප්‍රතිඵලයකි. දේශීය පොල් පරිභෝජනය, මුළු පොල් නිෂ්පාදනයෙන් සියයට 59 ක් වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

1989 දී දැඩි පසුබෑමකට ලක්වුණු වී නිෂ්පාදනය 1990 දී සියයට 23 ක සිත් ඇදගන්නා සුළු වර්ධනයක් වාර්තා කරනු ලැබීය. කෙසේ වුවද, 1990 දී මෙට්‍රික් ටොන් දශ ලක්ෂ 2.54 ක් ලෙස තාවකාලිකව ඇස්තමේන්තු කරන ලද වී නිෂ්පාදනය, ඉහළම නිෂ්පාදන මට්ටම ලෙස 1985 දී වාර්තා ගත මෙට්‍රික් ටොන් දශ ලක්ෂ 2.66 ට වඩා සියයට 5 කින් අඩු විය. 1990 දී වී නිෂ්පාදනයෙහි ඇති වූ වැඩිවීම, 1989/90 මහ සහ 1990 යල යන කන්න දෙකෙහිම පිළිබිඹු විය. හිතකර කාළගුණික තත්ත්වය සහ දිවයින තුළ ආරක්ෂක තත්ත්වය යහපත්වීම හේතුවෙන් වපුරන ලද බිම් ප්‍රමාණය හා අස්වද්දන ලද බිම් ප්‍රමාණය විශාල වශයෙන් වැඩිවීම සහ සාමාන්‍ය ඵලදාව සුළු වශයෙන් වැඩිවීම නිෂ්පාදනයේ ඇතිවූ මෙම යහපත් තත්ත්වයට හේතු සාධක විණි. 1990 දී දේශීය වශයෙන් නිෂ්පාදිත සහල් ප්‍රමාණය දේශීය සහල් අවශ්‍යතාවයන්ගෙන් සියයට 88 ක් සපුරාලීමට ප්‍රමාණවත් වූ අතර එය පසුගිය වසරේදී සියයට 73 ක් විය.

වී අලෙවි මණ්ඩලය විසින් මිළදී ගත් වී ප්‍රමාණය 1989 දී සියයට 95 කින් පහත වැටුණු අතර එය 1990 දී මෙට්‍රික් ටොන් 31,000 ක් දක්වා හය ගුණයක වැඩිවීමක් වාර්තා කළේය. මෙයට හේතු වූයේ 1990 මාර්තු 23 දින සිට 1990 මැයි 7 දින දක්වා කාලය තුළදී සහතික මිළට වඩා ඉහලින් පැවති වෙළෙඳපොල මිළ ගණන් යටතේ වී මෙට්‍රික් ටොන් 28,000 ක් මිළදී ගනු ලැබීමයි. වී සඳහා වූ සහතික මිළ, 1990 පෙබරවාරි මසදී බුසලකට රුපියල් 80 සිට බුසලකට රුපියල් 110 දක්වා ඉහළ නංවනු ලැබින. 1989 දී මෙන්ම 1990 වසර තුළදීද වී සඳහා වූ විවෘත වෙළෙඳපොල මිළ ගණන් සහතික මිළට වඩා ඉහලින් පැවතිණි.

1989 දී සුළු වර්ධනයක් පමණක් වාර්තා කරනු ලැබූ සීනි නිෂ්පාදනය, 1990 දී සියයට 6 කින් වැඩි වී මෙට්‍රික් ටොන් 57,171 ක් විය. යහපත් ආරක්ෂක තත්ත්වය, ප්‍රමාණවත් වර්ෂාපතනය සහ පිට වගාකරුවන්ගේ වැවිලි කටයුතු පුළුල්වීම, නිෂ්පාදනයේ වූ මෙම වැඩිවීමට විශාල වශයෙන් හේතු විණි. කන්තලේ, සෙවනගල සහ පැල්වත්ත යන සීනි නිෂ්පාදන කම්හල් මෙම වැඩි වීමට දායක විණි. පසුගිය වසරේදී සියයට 62 කින් වැඩි වූ කන්තලේ කම්හලේ නිෂ්පාදනය 1990 දී මෙට්‍රික් ටොන් 2,364 දක්වා තවදුරටත් සියයට 3 කින් වැඩිවිය. ඉකුත් වසරේදී සියයට 19 කින් පහත වැටුණු සෙවනගල කම්හලේ නිෂ්පාදනය 1990 දී මෙට්‍රික් ටොන් 9,648 දක්වා සියයට 8 ක වර්ධනයක් පෙන්නුම් කරනු ලැබින. 1989 දී සියයට 5 ක අඩුවීමක් වාර්තා කරනු ලැබූ පැල්වත්ත කම්හලේ නිමැවුම 1990 දී මෙට්‍රික් ටොන් 33,020 දක්වා සියයට 16 ක වැඩිවීමක් වාර්තා කෙරිණි. එසේම, 1990 වසරේ මුළු සීනි නිෂ්පාදනයෙන් සියයට 58 කට පැල්වත්ත කම්හල හිමිකම් පානු ලැබින.

ඉකුත් වසරේ පැවති පහත් නිෂ්පාදන මට්ටම හා සසඳන කල සුළු ආහාර භෝග බොහෝ සංඛ්‍යාවක නිෂ්පාදනය සැළකිය යුතු ලෙස වැඩි විය. සෝයා බෝංචි, තල, උඳු, ඉරිඟු, මුං ඇට සහ කව්පි නිෂ්පාදනය සැළකිය යුතු ලෙසින් ඉහළ නැගිණි. වැඩි වටිනාකමින් යුත් සුළු

ආහාර භෝග කාණ්ඩය යටතේ, මිරිස් සහ ලොකු ළූණු නිෂ්පාදනය පිළිවෙලින් සියයට 75 ක සහ සියයට 70 ක සැළකිය යුතු වැඩිවීම් වාර්තා කරනු ලැබිණි. අපනයන සංඛ්‍යා ලේඛන වලට අනුව, කරාබු නැටි හා කොකෝවා හැරුණු විට සුළු අපනයන භෝග වැඩි ප්‍රමාණයක පසුගිය වසර හා සසඳන කල අසතුටුදායක ක්‍රියාකාරිත්වයක් දක්නට ලැබුණි. කරාබු නැටි අපනයන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 2,137 දක්වා හය ගුණයකින් ඉහළ ගිය අතර වසර තුළදී කොකෝවා අපනයන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 168 දක්වා සියයට 39 කින් වැඩි විය. 1989 දී විශාල වශයෙන් පහත වැටුණු ගම්මිරිස්, කෝපි සහ කරදමුංගු අපනයන පරිමාවන් 1990 දී තවදුරටත් පිළිවෙලින් සියයට 17, සියයට 28 සහ සියයට 73 ක අඩුවීම් වාර්තා කෙරිණි.

මුහුදු ධීවර අංශයේ මත්ස්‍ය නිෂ්පාදනය, 1990 වර්ෂයේ මෙට්‍රික් ටොන් 145,798 ක් ලෙස තාවකාලිකව ඇස්තමේන්තු කර ඇති අතර, එය පසුගිය වර්ෂයට වඩා සියයට 12 ක අඩුවීමක් විය. මුළු මුහුදු ධීවර මත්ස්‍ය නිෂ්පාදනයෙන් සියයට 92 ක් වූ වෙරළබඩ ධීවර අංශයේ නිෂ්පාදනය සියයට 15 කින් අඩුවූ අතර එයට හේතුවූයේ 1990 වසරේ අග භාගයේ දිවයිනේ උතුරු හා නැගෙනහිර පළාත්වල පැවති අස්ථාවර තත්ත්වය, ධීවර කටයුතු කෙරෙහි අහිතකර ලෙස බලපෑමයි. පෙර වර්ෂවලදී මෙන්ම, 1990 වර්ෂයේදී ද මත්ස්‍ය නිෂ්පාදනයට මුළුමනින්ම පාහේ දායකත්වය දෙනු ලැබුයේ පෞද්ගලික අංශය මගිනි.

ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ තාවකාලික ගණන් බැලීම්වලට අනුව 1990 දී නිෂ්පාදනය කළ කිරි ප්‍රමාණය (මී කිරි ඇතුළුව) ලීටර් දශ ලක්ෂ 288 ක් වූ අතර, එය පසුගිය වර්ෂයට වඩා සියයට 21 ක වැඩිවීමක් පෙන්නුම් කරනු ලැබීන. මේ අතර, මුළු බිත්තර නිෂ්පාදනය, පසුගිය වර්ෂයට වඩා සියයට 2 ක අඩුවීමක් පෙන්නුම් කරමින් දශ ලක්ෂ 818 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

ඉහළ නිෂ්පාදන මට්ටම් සහ ඉහළ එකතු කළ අගයන්ගෙන් පිළිබිඹු වූ පරිදි 1990 වර්ෂයේ දී කර්මාන්ත අංශයේ කැපී පෙනෙන වර්ධනයක් ඇතිවිය. රටේ බොහෝ පළාත් වල පැවැති කලබලකාරී තත්ත්වය යහපත් අතට හැරීමත් සමඟම, කාර්මික කටයුතුවල ඇතිවූ පුනර්ජීවනය මෙයට බෙහෙවින්ම හේතු විය. පසුගිය වර්ෂ දෙකෙහිදී මූර්ත වශයෙන් සියයට 6 කින් වර්ධනය වූ කාර්මික නිෂ්පාදනය, 1990 වර්ෂයේදී සියයට 14 කින් වර්ධනය වූ අතර, එය 1984 න් පසු වාර්තා වූ ඉහළම වර්ධන වේගය විය. පසුගිය වසර කිහිපය තුළදී මෙන් නොව, කාර්මික නිෂ්පාදනයේ වූ මෙම සිත් ගන්නා සුළු වර්ධනයට පෞද්ගලික අංශයේ කර්මාන්තයන්හි අඛණ්ඩව ඇතිවූ ප්‍රසාරණය මෙන්ම රාජ්‍ය අංශයේ කර්මාන්තයන්හි පෙන්නුම් කළ යහපත් ක්‍රියාකාරිත්වයද ඉවහල් විය. පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය අංශයේ කාර්මික නිමැවුම සියයට 14 බැගින් වර්ධනය විය.

1990 දී නිෂ්පාදන වැඩිවීම් වාර්තා කළ කාර්මික උප අංශයන් වූයේ රසායනික ද්‍රව්‍ය, ඛණිජ තෙල් හා ප්ලාස්ටික් නිෂ්පාදිත (සියයට 37), මූලික ලෝහ නිෂ්පාදිත (සියයට 24), සකස් කළ ලෝහ නිෂ්පාදිත (සියයට 12), රෙදිපිළි, ඇඳුම් පැළඳුම් හා සම් නිෂ්පාදිත (සියයට 13), කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත (සියයට 9) සහ ආහාර, පාන වර්ග හා දුම්කොළ (සියයට 7) යනාදිය ය.

රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත ගණයේ නිමැවුම සැළකිය යුතු ලෙස ඉහළ යාමට මූලික වශයෙන් බලපානු ලැබුවේ ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ නිමැවුමෙහි ඇතිවූ සීඝ්‍ර වැඩිවීම සහ මෙම කාර්මික ගණයේ තීන්ත, වාර්නිෂ්, සබන්, සුවඳ විලවුන් සහ රබර් නිෂ්පාදිත වැනි පෞද්ගලික අංශයේ කර්මාන්තයන්හි ඇතිවූ සැළකිය යුතු වැඩිවීමය. ආයෝජන ප්‍රවර්ධන කලාපයන් තුළ මෙන්ම ඉන් පිටතද ඇඟලුම් කර්මාන්තය අඛණ්ඩව ප්‍රසාරණය වීම, රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත කාර්මික ගණයේ ඉහළ නිමැවුම් මට්ටම් සඳහා ප්‍රධාන වශයෙන් දායක වීය. සකස් කළ ලෝහ නිෂ්පාදිත කාර්මික ගණයේ වැඩි දියුණුව කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපානු ලැබුයේ, සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ

උපකරණ සහ ව්‍යුහමය ලෝහ නිෂ්පාදිත වැනි පෞද්ගලික අංශයේ කර්මාන්ත ගණනාවක ඇතිවූ නිමැවුමේ ඉහළ යාමයි. වානේ සංස්ථාවේ වැඩිවූ නිෂ්පාදනය, මූලික ලෝහ නිෂ්පාදිත කාර්මික ගණයේ ඉහළ නිමැවුම් මට්ටම සඳහා හේතු විය. ආහාර පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත ගණය තුල නිමැවුමේ වැඩිවීම් ප්‍රධාන වශයෙන් වාර්තා වූයේ දුම්කොළ, සීනි, තේ පැකට් කිරීම්, සිසිල් බීම, මත්පැන් නිෂ්පාදිත සහ රසකැවිලි නිෂ්පාදනයේ නියැලුණු පෞද්ගලික අංශයේ කර්මාන්ත වලය. ජාතික කඩදාසි සංස්ථාව මෙන්ම පෞද්ගලික අංශයේ කර්මාන්තයන්ද, කඩදාසි සහ කඩදාසි නිෂ්පාදිත කාර්මික ගණයේ ඉහළ නිමැවුම් මට්ටම් සඳහා බෙහෙවින් දායක විය.

ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ නිෂ්පාදන මට්ටම ඉහළ යෑම රාජ්‍ය අංශයේ කාර්මික නිමැවුමේ සැළකිය යුතු වැඩිවීමට ප්‍රධාන වශයෙන්ම හේතුවිය. වර්ෂය තුළදී නිෂ්පාදන වැඩිවීම් වාර්තා කළ රාජ්‍ය අංශයේ ව්‍යවසායයන් වූයේ ස්කාගාර සමාගම (සියයට 158), ලංකා ඛනිජ තෙල් (සියයට 49), ලංකා සම් භාණ්ඩ (සියයට 35), රාජ්‍ය පතල් කැනීම් සහ ඛනිජ සංවර්ධන (සියයට 29), රාජ්‍ය රබර් නිෂ්පාදන (සියයට 22), ලංකා පිඟන් (සියයට 17), කැළණි ටයර් (සියයට 10), ලංකා වානේ (සියයට 5) සහ ලංකා ලෝහ (සියයට 4) යනාදියයි.

වර්ෂය තුළදී නිෂ්පාදන අඩුවීම් වාර්තා කළ රාජ්‍ය අංශයේ ව්‍යවසායයන් වූයේ ජාතික ලුණු (සියයට 64), ජාතික පේෂකර්ම (සියයට 45), ලංකා තුනී ලැලි (සියයට 42), ලංකා ඛනිජ වැලි (සියයට 35), තෙල් හා මේද (සියයට 16) සහ ශ්‍රී ලංකා සිමෙන්ති (සියයට 5) යනාදියයි. ජාතික ලුණු සංස්ථාවේ නිමැවුම පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ උතුරු ප්‍රදේශයේ පැවැති අශුභවාදායක ආරක්ෂක තත්ත්වයන් යටතේ ලුණු ලේවායයන්හි නිමැවුම පහත වැටීමයි. 1990 වර්ෂය තුළදී තුල්හිරිය සහ පූගොඩ පෙහෙකම්හල්හි අයිතිය රාජ්‍ය අංශයෙන් පෞද්ගලික අංශයට පැවරීම, ජාතික පේෂකර්ම සංස්ථාවේ නිමැවුමෙහි සීඝ්‍ර පහත වැටීමට ප්‍රධාන හේතුව විය. ''ක්ලින්කර්'' සැපයුම ප්‍රමාණවත් පරිදි සිදු නොවීම, ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ නිෂ්පාදනය කෙරෙහි අහිතකර ලෙස බලපාන ලදී. අලෙවිකරණ ගැටළු, තෙල් හා මේද සමාගමේ නිමැවුම අඩුවීම සඳහා හේතු විය.

වර්ෂය තුලදී රාජ්‍ය අංශයේ කාර්මික ව්‍යවසායයන් වෙත, අයවැයෙන් කරනු ලැබූ සංක්‍රාම රුපියල් දශ ලක්ෂ 111 ක් වූ අතර, එය පසුගිය වර්ෂය සමඟ සසඳන කල සියයට 71 ක අඩුවීමක් විය. ශ්‍රී ලංකා සීනි සංස්ථාව සහ ජාතික පේෂකර්ම සංස්ථාව මගින් පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 69 ක් සහ රුපියල් දශ ලක්ෂ 42 ක් ප්‍රාග්ධන සංක්‍රාම වශයෙන් වර්ෂය තුලදී ලබා ගන්නා ලදී.

කර්මාන්ත අංශයේ ආයෝජන කටයුතු 1990 වර්ෂය තුළදී ද අඛණ්ඩව වර්ධනය විය. මහ කොළඹ ආර්ථික කොමිසම (ම.කො.ආ.කො.) 1990 ජනවාරි මසදී විදේශීය ආයෝජකයින් වෙනුවෙන් කටයුතු කිරීමේ ''එකම ආයතනය'' ලෙස ක්‍රියාත්මක වීම සඳහා විදේශීය ආයෝජන උපදේශක කමිටුව (වි.ආ.උ.ක.) හා ඒකාබද්ධ කරන ලදී. එමගින් 1990 වර්ෂය තුළදී ව්‍යාපෘතීන් 30 ක් ''ම.කො.ආ.කො. තත්ත්වයන්'' යටතේ අනුමත කරන ලද අතර, වර්ෂය අවසානය වන විට අනුමත කළ මුළු ව්‍යාපෘතීන් සංඛ්‍යාව 337 දක්වා වැඩිවිය. 1990 දී අනුමත කරන ලද ව්‍යවසායයන්ගේ මුළු ආයෝජන ශක්‍යතාවය, රුපියල් දශ ලක්ෂ 1,630 ක විදේශීය ආයෝජන ප්‍රමාණයද ඇතුළුව රුපියල් දශ ලක්ෂ 2,075 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

මහ කොළඹ ආර්ථික කොමිසම ''එකම ආයතනය'' ලෙස ස්ථාපිත කිරීමෙන් අනතුරුව ''විදේශීය ආයෝජන උපදේශක කමිටු තත්ත්වයන් යටතේ'' මහ කොළඹ ආර්ථික කොමිසමෙහි සහන නොලබන ව්‍යාපෘතීන් 47 ක් සඳහා අනුමැතිය දී ඇත. මෙම ව්‍යාපෘතීන්ගෙන් අපේක්ෂිත මුළු ආයෝජන ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1,089 ක් වන අතර, ඉන් විදේශීය ආයෝජන ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 280 ක් විය.

මිළ වැඩිවීමේ අනුපාතය සැළකිය යුතු ලෙස වේගවත් වීම, 1990 වසරේ ආර්ථික ක්‍රියාකාරීත්වයෙහි දක්නට ලැබුණු බෙහෙවින් කනස්සල්ලට හේතුවූ කරුණක් විය. 1990 දී කොළඹ පාරිභෝගිකයින්ගේ මිළ දර්ශකයෙහි වාර්ෂික සාමාන්‍යය සියයට 21.5 ක වර්ධන වේගයක් වාර්තා කළ අතර, එය 1980 න් පසු වාර්තා වූ ඉහළම වර්ධන වේගය විය. මෙම වැඩිවීම 1989 වර්ධන වේගය මෙන් දෙගුණයකට ආසන්න විය. එක් ලක්ෂ්‍යයක සිට තවත් ලක්ෂ්‍යයක පදනම මත (1989 දෙසැම්බර් සිට 1990 දෙසැම්බර් දක්වා) මිළ දර්ශකයේ වාර්ෂික වැඩිවීම සියයට 19.6 ක් වූ අතර, එය මඳක් අඩු වීමක් විය. තොග අලෙවි මිළ දර්ශකයෙහිද වාර්ෂික සාමාන්‍ය වර්ධන වේගය සියයට 22.2 ක් වූ අතර, එතුලින් පිළිබිඹු වූයේ ප්‍රාථමික වෙළෙඳපොළ තත්ත්වයන් යටතේද මිළ මට්ටම් වැඩිවීමේ ප්‍රවණතාවයන් පැවතුන බවයි. 1989 වර්ෂයේ තොග අලෙවි මිළ දර්ශකයේ වැඩිවීම සියයට 9 ක් පමණක් විය.

1990 වර්ෂයේදී ආර්ථිකයේ මිළ ගණන් මත නොකඩවාම ඇතිවූ දැඩි පීඩනයට විවිධ සාධක හේතු විය. ප්‍රථමයෙන්ම, පාළිත මිළ ගණන් නිවැරදි ලෙස ගැලපුම් කිරීමේ හේතුවෙන් ඇතැම් වැදගත් පාරිභෝගික ද්‍රව්‍ය වන තිරිඟු පිටි සහ පාන් ආදියෙහි මිළ වර්ෂයේ ප්‍රථම භාගයේ දී ඉහළ නැගිණි. දෙවනුව, එම මිළ ගැලපුම්වල ආදේශන බලපෑම හේතුකොටගෙන අනෙකුත් ආහාර ද්‍රව්‍යයන් වන සහල් සහ ධාන්‍ය වර්ගයන්හි මිළ කෙරෙහි වැදගත් බලපෑමක් ඇති කරනු ලැබිණි. තෙවනුව, 1990 ජනවාරි මසදී පොහොර සහනාධාරය ඉවත් කිරීම, ඉහළ නිෂ්පාදන පිරිවැයකට තුඩුදුන් අතර, එය අනෙක් අතට මිළ කෙරෙහි බලපානු ලැබිනි. සිව්වෙනුව තාවකාලික සැපයුම් හිඟයක් හේතුකොටගෙන මාළු, මස්, එළවලු, අල සහ රතුළූනු වැනි ප්‍රධාන ආහාර ද්‍රව්‍යවල මිළ ගණන් සැළකිය යුතු ලෙසින් වැඩිවිය. පස්වෙනුව, විශේෂයෙන් වර්ෂයේ අවසාන මාස කිහිපය තුල ගල්fප් අර්බුදය හේතුවෙන් කරන ලද ඉන්ධන මිළ සංශෝධනයද ඍජු සහ වක්‍ර ලෙසින් මිළ කෙරෙහි බලපාන ලදී. සය වෙනුව, 1990 දී විදුලිබල සහ තැපැල් ගාස්තු ඉහළ නංවනු ලැබිණි.

1990 වර්ෂය තුළ ඉහත සඳහන් කරුණු මිළ ඉහළ යාමට බලපානු ලැබුවද, අධික මූල්‍ය ප්‍රසාරණය මගින් උත්පාදනය කළ ඉල්ලුමෙහි පීඩනයද ආර්ථිකයේ උද්ධමනාත්මක පීඩනයට සුළුපටු නොවන ලෙසින් දායක වූ බව සඳහන් කළ යුතුය. පුළුල් මූල්‍ය සමස්ථයන්ගේ වර්ධනය සාපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමක පැවතුන අතර එහි වාර්ෂික වර්ධනය සියයට 13.1 සහ සියයට 19.1 අතර පරාසයක විය. මූල්‍ය ප්‍රසාරණයේ වේගය ආර්ථිකයේ මූර්ත වර්ධන වේගය ඉක්මවන විට, ඉල්ලුමෙහි ඇතිවන පරතරය පියවීමට ප්‍රමාණවත් ආයාත අතිරික්තයක් නොමැති අවස්ථාවකදී එය නියත වශයෙන්ම මිළ කෙරෙහි බලපෑම් ඇතිකරයි.

1990 වසර තුළදී මිළ පීඩනය පුළුල් පෙරමුණක ව්‍යාප්ත විය. කොළඹ පාරිභෝගිකයින්ගේ මිළ දර්ශකයේ ආහාර සඳහා වූ උප දර්ශකය සියයට 23 ක සාමාන්‍යයකින් ඉහළ නැඟිණි. එය මුළු දර්ශකයේ වැඩිවීමෙන් සියයට 74.4 කට දායක විය. වර්ෂය තුළදී ආහාර ද්‍රව්‍යවල මිළ කෙරෙහි බලපෑ නිවැරදි මිළ ගැලපුම් පෙළ, නිරන්තරවම දර්ශකය ඉහළ නංවාලීමට හේතුවිය. පසුගිය වර්ෂයේ සියයට 17 කින් වැඩි වූ ඇඳුම් මිළ 1990 දී සියයට 18 කින් වැඩිවිය. මේ අතර ඉන්ධන සහ ආලෝක ද්‍රව්‍යවල මිළ සියයට 24 කින් එනම් පසුගිය වර්ෂයේ වර්ධන වේගයට වඩා දෙගුණයකින් වැඩි විය. 1989 වසරෙහි වාර්තා වූ සියයට 16 ක වර්ධනය ඉක්මවමින් විවිධ භාණ්ඩ සඳහා වූ උප දර්ශකය සියයට 19 කින් විමසුමට ලක්වන වර්ෂයේදී ඉහළ නැගිණි. මුළු දර්ශකයේ වැඩිවීම කෙරෙහි මෙම උප අංශයේ දායකත්වය සියයට 14 ක් වූ අතර එය වාර්තා වූ දෙවැනි ඉහළම දායකත්වය විය.

ප්‍රාථමික වෙළෙඳපොල මට්ටමෙහි මිළ වෙනස්වීම මණිනු ලබන තොග අලෙවි මිළ දර්ශකය මගින් 1990 වසර තුළ ආර්ථිකයේ මූලික මිළ පීඩනයක් පෙන්නුම් කරන ලදී. 1989 සියයට 9 ක වැඩිවීම හා සැසඳීමේදී 1990 තොග අලෙවි මිළ දර්ශකයෙහි වාර්ෂික සාමාන්‍යය සියයට 22 කින් ඉහළ නැගිණි. එක් ලක්ෂ්‍යයක සිට තවත් ලක්ෂ්‍යයක් දක්වා මිළ වෙනස්වීමේ පදනම

මත (එනම් 1989 දෙසැම්බර් සිට 1990 දෙසැම්බර් දක්වා) මෙම දර්ශකය සියයට 17 ක වැඩිවීමක් වාර්තා කළේය. කොළඹ පාරිභෝගිකයින්ගේ මිළ දර්ශකයෙහි මෙන්ම තොග අලෙවි මිළ දර්ශකයෙහිද ඉහළ නැගීම කෙරෙහි, වැඩිවූ ආහාර ද්‍රව්‍ය මිළ ගණන් සැළකිය යුතු බලපෑමක් ඇති කරන ලදී. තේ සඳහා වූ සාමාන්‍ය අපනයන මිළ යහපත් වීම, වර්ෂය තුළ දර්ශකය ඉහළ නැංවීමට හේතු වූ ප්‍රධාන සාධකයක් විය. ගල්ෆ් අර්බුදයත් සමගම, වර්ෂය තුළදී ඛනිජ තෙල් නිෂ්පාදිතයන්ගේ සාමාන්‍ය මිළ සියයට 23 කින් වැඩිවීම තවත් වැදගත් සාධකයක් විය.

රජයේ සේවකයින්ගේ වැටුප් අනුපාතික දර්ශකයෙන් මනිනු ලැබූ, එම සේවකයින්ගේ සාමාන්‍ය නාමික වැටුප් මට්ටම, 1990 දී සියයට 13 ක තියුණු වැඩිවීමක් පෙන්නුම් කරනු ලැබිණි. මෙයට, රාජ්‍ය අංශයේ සුළු සහ මධ්‍යම වැටුප් තලයන්හි නියුතු සේවකයින් වෙනුවෙන් උද්ධමනයට සහනයක් සැලසීම සඳහා කරන ලද විශේෂ ගෙවීම් දෙකක් හේතු විය. කෙසේ වෙතත්, රාජ්‍ය අංශයේ සේවකයන්ගේ නාමික වැටුප් මට්ටම සැළකිය යුතු ලෙසින් ඉහළ ගියද, වර්ෂය තුළදී ආර්ථිකයේ පැවැති ඉහළ මිළ පීඩනය හේතුකොටගෙන මූර්ත වැටුප් මට්ටම සියයට 7.1 කින් පහත වැටිණි. මේ අතර පඩි පාලක සභා මගින් ආවරණය වූ කර්මාන්තයන්හි නියුතු සේවකයින් සඳහා වූ අවම වැටුප් අනුපාතික දර්ශකයෙන් මනින ලද, සංවිධානය වූ පෞද්ගලික අංශයේ සේවකයින්ගේ නාමික වැටුප් සියයට 16.9 කින් වැඩි වූ අතර, මූර්ත වැටුප් 1990 දී සියයට 3.9 කින් අඩුවිය.

තාවකාලික ඇස්තමේන්තුවලට අනුකූලව, 1990 වර්ෂයේදී පෞද්ගලික අංශයේ සේවා නියුක්තිය සැළකිය යුතු ලෙස වැඩිවූ අතර, රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය අඩු විය. රාජ්‍ය අංශය තුළ, අර්ධ රාජ්‍ය අංශයේ ආයතනවල සේවා නියුක්තිය කැපී පෙනෙන ලෙස අඩුවිය. 1990 අවසානය වන විට මුළු රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය සියයට 1.5 ක අඩුවීමක් පෙන්නුම් කරමින් පුද්ගලයන් 1,318,150 ක් බවට ඇස්තමේන්තු කර ඇත. රාජ්‍ය සේවය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන යටතේ, ආරක්ෂක සේවකයින් අයත්වන සේවාවන්හි නියුක්ත සේවකයින් ගණය හැරුණුකොට, අනෙකුත් සියළුම ගණයයන්හි සේවා නියුක්තිය 1990 දී අඩු හෝ නොවෙනස් ලෙස පැවතිණි. මේ අතර අර්ධ රාජ්‍ය අංශයේ ආයතනවල සේවා නියුක්තිය වර්ෂය තුළ සියයට 5.5 කින් සැළකිය යුතු ලෙස අඩුවිය.

පෞද්ගලික අංශයේ සේවා නියුක්තිය පිළිබඳ අඛණ්ඩ වාර්ෂික දත්ත නොමැතිවීම හේතු කොටගෙන, එම අංශයේ වෙනස්වීම් තක්සේරු කිරීම සඳහා වෙනත් නිර්නායකයන් යොදාගනු ලැබිනි. සේවක අර්ථසාධක අරමුදලෙහි (සේ.අ.අ.) ලියාපදිංචි වූ සේවකයින්ගේ සංඛ්‍යාව 1990 දී සියයට 4.3 කින් ඉහළ ගිය අතර, අනුමත කළ අර්ථසාධක අරමුදල් හි ලියාපදිංචි පෞද්ගලික අංශයේ මුළු සේවක සංඛ්‍යාව සියයට 44.6 ක වැඩිවීමක් වාර්තා කළේය. මේ අතර මහ කොළඹ ආර්ථික කොමිසම යටතේ කටයුතු කරන ආයතනයන්හි මුළු සේවා නියුක්තිය 1990 දී පුද්ගලයන් 71,555 ක් වූ අතර, එය සියයට 16.5 ක වැඩිවීමක් විය. මේවා සමඟ, දුප්පත්කම දුරුකරලීමේ වැඩසටහන් සහ ආයතනික ආධාර වැඩසටහන් යටතේ ඇතිකරන ලද විශාල සංඛ්‍යාවක ස්වයං රැකියා අවස්ථාවන් සළකා බලන කල වසර තුළදී පෞද්ගලික අංශයේ සේවා නියුක්ති අවස්ථාවන්හි සැළකියයුතු ප්‍රසාරණයක් ඇතිවූ බව දක්නට ලැබිණි.

ජාත්‍යන්තරව පැවැති අවිනිශ්චිතභාවය මධ්‍යයේ වුවද, 1990 දී ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳ අංශයේ වර්ධනය පසුගිය වසරට වඩා යහපත් විය. 1989 වර්ෂයේ සියයට 11 ක වර්ධනය හා සසඳන විට, වෙළෙඳ භාණ්ඩ අපනයන වටිනාකම ඩී.ගැ.හි. දශ ලක්ෂ 1,461 (රුපියල් දශ ලක්ෂ 79,481) දක්වා සියයට 20 කින් වැඩිවිය. මෙය පසුගිය පස් වසර තුළ අපනයන වර්ධනයේ ඇතිවූ ඉහළම වාර්ෂික වර්ධනයයි. අනෙක් අතට, 1989 දී සියයට 5 ක වැඩිවීමට සාපේක්ෂව ආනයන වියදම ඩී.ගැ.හි. දශ ලක්ෂ 1,980 (රුපියල් දශ ලක්ෂ 107,729) දක්වා සියයට 14 කින් ඉහළ ගියේය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, වෙළෙඳ හිඟය ඩී.ගැ.හි. දශ ලක්ෂ 519 (රුපියල්

දශ ලක්ෂ 28,248) ක් වූ අතර, එය පසුගිය වර්ෂයේ පැවති මට්ටමට සමාන විය. මේ අතර, අපනයන ඉපැයුම් ආනයන වියදම්වල අනුපාතයක් වශයෙන් සළකන කල 1989 වර්ෂයේ සියයට 70 සිට 1990 වර්ෂයේ සියයට 74 දක්වා සැළකිය යුතු ලෙසින් ඉහළ ගියේය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ අපනයන හා ආනයනවල සමස්ත මිළ වෙනස්වීම් දිගින් දිගටම අයහපත් තත්ත්වයක පැවතිණි. ඒ අනුව, අපනයන මිළයන්හි විශේෂයෙන් තේ අපනයන මිළෙහි සැළකිය යුතු වර්ධනයක් ඇති වුවද, විදේශ වෙළෙඳ අනුපාතය 1990 දී සියයට 10 කින් පිරිහිණි. මෙය ඛනිජ තෙල්, පොහොර වර්ග සහ සීනි වැනි ප්‍රධාන අයිතමයන්ගේ ආනයන මිළෙහි ඇතිවූ තියුණු වැඩිවීමක ප්‍රතිඵලයක් විය.

අපනයන අතර රබර් සහ පොල් හැරුණුවිට කෘෂිකාර්මික, කාර්මික සහ ඛනිජමය නිෂ්පාදන ආදී සියළුම ප්‍රධාන අපනයන කාණ්ඩයන් 1990 දී සැළකිය යුතු වැඩිවීම් වාර්තා කරන ලදී. කෘෂිකාර්මික අපනයන ඉපැයුම්, පසුගිය වර්ෂයේ ඇතිවූ සියයට 1 ක සුළු වර්ධනය හා සසඳන විට සියයට 11 කින් වැඩිවිය. 1989 වර්ෂයේ සියයට 16 ක වැඩිවීම හා සසඳන කල 1990 දී කාර්මික අපනයන සියයට 24 ක සිත්ගන්නා සුළු වර්ධනයක් වාර්තා කළේය. මේ අතර 1989 දී සියයට 5 ක අඩුවීමක් වාර්තා කළ ඛනිජමය අපනයන 1990 දී සියයට 10 කින් වර්ධනය විය. සාමාන්‍යයෙන් ගත් කල, 1989 සිට ක්‍රියාත්මක කළ ගැලපුම් ක්‍රියාමාර්ගයන්ට ධනාත්මක ප්‍රතිචාර දක්වමින්, සම්ප්‍රදායික නොවන අපනයන අංශය 1990 වසර තුළදී කැපී පෙනෙන ක්‍රියාශීලිත්වයක් පෙන්නුම් කළ බව දක්නට ලැබිණි.

රේගු දත්ත පදනම මත, අපනයන ප්‍රමාණය හා මිළ යන දෙකෙහිම වැඩිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් තේ අපනයන වටිනාකම 1989 වි.ගැ.හි. දශ ලක්ෂ 296 (රුපියල් දශ ලක්ෂ 13,664) සිට 1990 දී වි.ගැ.හි. දශ ලක්ෂ 364 (රුපියල් දශ ලක්ෂ 19,823) දක්වා සියයට 23 කින් සැළකිය යුතු ලෙස වැඩිවිය. තේ අපනයන ප්‍රමාණය 1989 කිලෝග්‍රෑම් දශ ලක්ෂ 204 සිට 1990 කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 216 දක්වා සියයට 6 කින් වැඩි වූ අතර සාමාන්‍ය අපනයන මිළ වර්ෂ දෙක තුළදී කිලෝග්‍රෑමයකට වි.ගැ.හි. 1.45 (රුපියල් 66.91) සිට කිලෝ ග්‍රෑමයකට වි.ගැ.හි. 1.69 (රුපියල් 91.78) දක්වා සියයට 17 කින් වැඩිවිය. කෙසේ වුවද, රබර් අපනයන මිළ කිලෝග්‍රෑමයකට වි.ගැ.හි. 0.78 (රුපියල් 36.17) සිට කිලෝ ග්‍රෑමයකට වි.ගැ.හි. 0.65 (රුපියල් 35.50) දක්වා සියයට 17 කින් පහත වැටීම මුළුමනින්ම හේතුකොටගෙන, රබර් අපනයන වටිනාකම 1989 වි.ගැ.හි. දශ ලක්ෂ 67 (රුපියල් දශ ලක්ෂ 3,112) සිට 1990 දී වි.ගැ.හි. දශ ලක්ෂ 57 (රුපියල් දශ ලක්ෂ 3,080) දක්වා සියයට 15 කින් තවදුරටත් පහත වැටිණි. රබර් අපනයන ප්‍රමාණය 1989 දී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 86 සිට 1990 දී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 87 දක්වා සුළු වශයෙන් වැඩි විය. පොල් අපනයන ප්‍රමාණය ගෙඩි දශ ලක්ෂ 572 සිට ගෙඩි දශ ලක්ෂ 508 දක්වා සියයට 11 කින් පහතවැටීම හේතුවෙන් පොල් අපනයන වලින් ලද මුළු ඉපැයීම 1989 දී වි.ගැ.හි. දශ ලක්ෂ 62 (රුපියල් දශ ලක්ෂ 2,865) සිට 1990 දී වි.ගැ.හි. දශ ලක්ෂ 51 (රුපියල් දශ ලක්ෂ 2,783) දක්වා සියයට 18 කින් පහත වැටිණි. සාමාන්‍ය අපනයන මිළ ගෙඩියකට වි.ගැ.හි. 0.07 වශයෙන් නොවෙනස්ව පැවතුනු හෙයින්, අපනයන පරිමාවේ පහත වැටීමෙන් ඇතිවූ පාඩුව හිලව් කිරීමට මිළෙහි අනුපූරක බලපෑමක් නොමැති විය. සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත අපනයන වටිනාකම 1989 වි.ගැ.හි. දශ ලක්ෂ 52 (රුපියල් දශ ලක්ෂ 2,408) සිට 1990 දී වි.ගැ.හි. දශ ලක්ෂ 58 (රුපියල් දශ ලක්ෂ 3,165 ) දක්වා වැඩිවිය. මේවා අතුරින් එළවළු, කරාබුනැටි, දුම්කොළ, තල ඇට සහ කජුමද අපනයනවලින් ලද ඉපැයීම්වල සැළකිය යුතු වැඩිවීම් වාර්තා විය. කාර්මික අපනයන ඉපැයීම් 1989 දී වි.ගැ.හි. දශ ලක්ෂ 616 (රුපියල් දශ ලක්ෂ 28,470) සිට 1990 දී වි.ගැ.හි. දශ ලක්ෂ 763 (රුපියල් දශ ලක්ෂ 41,510) දක්වා වැඩිවිය. මෙය රෙදිපිළි හා ඇඟලුම් (සියයට 21), ඛනිජ තෙල් නිෂ්පාදිත (සියයට 49) සහ අනෙකුත් කාර්මික අපනයනයන් (සියයට 22) ආදී සියළුම කාර්මික අපනයන කාණ්ඩයන්හි වූ සිත්ගන්නා සුළු වර්ධන අනුපාතිකයන්ගේ ප්‍රතිඵලයක් විය. පසුගිය වසරේ පසුබෑමකට ලක්වූ ඛනිජමය අපනයන වි.ගැ.හි. දශ ලක්ෂ 58 (රුපියල් දශ ලක්ෂ 2,693) සිට වි.ගැ.හි. දශ ලක්ෂ 64 (රුපියල් දශ ලක්ෂ 3,484) දක්වා සියයට 10 කින් වැඩිවිය. මෙයට මුළුමනින්ම හේතුවූයේ මැණික් අපනයන ඉපැයීම් සියයට 13 කින් වැඩිවීමය.

මෙම වර්ධනයන් සමඟම, 1990 දී අපනයන සංයුතියෙහි තවදුරටත් වෙනස්කම් ඇතිවිය. කාර්මික අපනයන කාණ්ඩයෙහි වූ දායකත්වය අදාල වර්ෂ දෙක තුළදී සියයට 51 සිට සියයට 52 දක්වා වැඩිවෙමින්, ප්‍රධාන අපනයන කාණ්ඩය වශයෙන් එයට හිමි තැන තවදුරටත් ශක්තිමත් කරගනු ලැබිණි. මීට ප්‍රතිවිරුද්ධව, 1977 දී මුළු අපනයන ඉපැයීම් වලින් හතරෙන් තුනකට දායක වූ වැවිලි කෘෂිකාර්මික භෝගවල දායකත්වය, 1989 දී සියයට 35 සිට 1990 දී සියයට 32 දක්වා තවදුරටත් පහත වැටිණි. එසේම ඛනිජමය අපනයනවල දායකත්වයද සියයට 5 සිට සියයට 4 දක්වා පහත වැටිණි. 1986 දී විශාලතම අපනයන අයිතමය බවට පැමිණුනු රෙදිපිළි හා ඇඟළුම්, එහි දායකත්වය 1989 දී සියයට 31 සිට 1990 දී සියයට 32 දක්වා තවදුරටත් වැඩි කරමින් තනි අපනයන අයිතමයක් ලෙස එයට හිමි ප්‍රධාන තැන අඛණ්ඩව පවත්වා ගනු ලැබිණි.

ගලපන ලද රේගු සංඛ්‍යාවලට අනුව, මුළු ආනයන වියදම 1989 වි.ගැ.හි. දශ ලක්ෂ 1,737 (රුපියල් දශ ලක්ෂ 80,225) හා සසඳා බලන කල 1990 දී සියයට 14 ක වැඩිවීමක් පෙන්වමින් වි.ගැ.හි. දශ ලක්ෂ 1,980 (රුපියල් දශ ලක්ෂ 107,729) ක් විය. මෙම වැඩිවීම සියළුම ආනයන කාණ්ඩ තුලින් පිළිබිඹු කරන ලදී. තිරිඟු පිටි සහ කල් පවතින පාරිභෝගික භාණ්ඩ වන මෝටර් රථ හා මෝටර් බයිසිකල් ආනයන වියදම වැඩිවීම හේතුවෙන්, පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම 1989 දී වි.ගැ.හි. දශ ලක්ෂ 454 (රුපියල් දශ ලක්ෂ 20,962) සිට 1990 දී වි.ගැ.හි. දශ ලක්ෂ 515 (රුපියල් දශ ලක්ෂ 28,004) දක්වා සියයට 13 ක වර්ධනයක් පෙන්විය. සහල් ආනයන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 3,16,000 සිට මෙට්‍රික් ටොන් 1,72,000 දක්වා තියුණු ලෙස පහත වැටීම හේතුවෙන් වර්ෂ දෙක ඇතුළතදී සහල් ආනයන වියදම වි.ගැ.හි. දශ ලක්ෂ 74 (රුපියල් දශ ලක්ෂ 3,397) සිට වි.ගැ.හි. දශ ලක්ෂ 32 (රුපියල් දශ ලක්ෂ 1,758) දක්වා සියයට 56 කින් තියුණු ලෙස පහත වැටිණි.

අදාල වර්ෂ දෙක තුළදී සියයට 10 ක වර්ධනයක් පෙන්නුම් කරමින් 1989 දී වි.ගැ.හි. දශ ලක්ෂ 980 (රුපියල් දශ ලක්ෂ 45,255) ක් වූ අන්තර් භාණ්ඩ ආනයන වියදම 1990 දී වි.ගැ.හි. දශ ලක්ෂ 1,078 (රුපියල් දශ ලක්ෂ 58,672) දක්වා වැඩිවිය. මෙයට වැඩි වශයෙන්ම හේතුවූයේ ඛනිජ තෙල්, පොහොර, රසායනික ද්‍රව්‍ය සහ කඩදාසි නිෂ්පාදිත සඳහා වූ ආනයන වියදම් වැඩිවීමය. ප්‍රධාන වශයෙන්ම ගල්ෆ් අර්බුදය නිසා මිළ ගණන් වැඩිවීම් හේතුවෙන් ඛනිජ තෙල් ආනයන වියදම වි.ගැ.හි. දශ ලක්ෂ 181 (රුපියල් දශ ලක්ෂ 8,376) සිට වි.ගැ.හි. දශ ලක්ෂ 264 (රුපියල් දශ ලක්ෂ 14,367) දක්වා සියයට 46 කින් තියුණු ලෙස වැඩි විය. පොහොර ආනයන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 3,55,000 සිට මෙට්‍රික් ටොන් 5,05,000 දක්වා වැඩිවීම නිසා පොහොර ආනයන වියදමද සියයට 43 කින් තියුණු ලෙස ඉහළ නැගිණි. කෙසේ වුවද, තිරිඟු ඇට සහ රෙදිපිළි ආනයන වියදම් 1990 දී පහත වැටිණි. ආනයන පරිමාව සියයට 21 කින් හා මිළ සියයට 18 කින් පහත වැටීම හේතුවෙන් තිරිඟු පිටි ආනයන වියදම 1990 වි.ගැ.හි. දශ ලක්ෂ 70 (රුපියල් දශ ලක්ෂ 3,791) දක්වා සියයට 35 කින් තියුණු ලෙස අඩුවිය. 1990 දී රෙදිපිළි හා ඇඟලුම් ආනයන වටිනාකම සියයට 6 කින් පහත වැටිණි.

ප්‍රධාන වශයෙන්ම ප්‍රවාහන උපකරණ හා යන්ත්‍රසූත්‍ර ආනයනය වැඩිවීම හේතුවෙන් ආයෝජන භාණ්ඩ ආනයන වියදම 1989 දී වි.ගැ.හි. දශ ලක්ෂ 260 (රුපියල් දශ ලක්ෂ 12,018) සිට 1990 දී වි.ගැ.හි. දශ ලක්ෂ 352 (රුපියල් දශ ලක්ෂ 19,129) දක්වා සියයට 35 කින් ඉහළ නැගිණි. කෙසේ වුවද, වර්ෂය තුළදී ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වටිනාකම පහත වැටිණි.

1990 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ආර්ථික ක්‍රියාකාරිත්වයෙහි කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ ගෙවුම් ශේෂ තත්ත්වය සැළකියයුතු ලෙසින් යහපත් අතට හැරීමයි. තේ මිළ ගණන් අඛණ්ඩව ඉහළයාම, සංචාරක අංශය ප්‍රකෘතිමත් වීම, විදේශ ආධාර වැඩි වශයෙන් උපයෝගී කර ගැනීම සහ ආරක්ෂක තත්ත්වය යහපත්වීම හේතුවෙන් ආර්ථික කටයුතු සාමාන්‍ය වශයෙන් යථා තත්ත්වයට පත්වීම යනාදී හිතකර සාධක ගණනාවක බලපෑමෙන් ගෙවුම් ශේෂ තත්ත්වය කැපී පෙනෙන ලෙසින් යහපත් අතට හැරිණි. ඉකුත් පස්වසර තුළදීම, සමස්ත ශේෂයෙහි වාර්තා ගත විශාල හිඟයන්ට ප්‍රතිවිරුද්ධව 1990 දී වි.ගැ.හි. දශ ලක්ෂ 130 (රුපියල් දශ ලක්ෂ 6,998) ක අතිරික්තයක් වාර්තා කරනු ලැබින. විශේෂයෙන්ම ඉහළ ඛනිජතෙල් මිළ ප්‍රමුඛව ගල්ෆ් අර්බුදයෙන් ඇතිවූ අහිතකර බලපෑම් මධ්‍යයේ ගෙවුම් ශේෂ ක්‍රියාකාරිත්වයෙහි ඇතිවූ මෙම යහපත් තත්ත්වය වැදගත් කොට සැළකිය යුතුය.

Central Bank of Sri Lanka
22773
16 JUN 2009
LIBRARY & INFORMATION CENTRE
Communication Department



## 1.3 සංඛ්‍යා සටහන

### ගෙවුම් තුලන සාරාංශය 1987 – 1990

රුපියල් දශ ලක්ෂ (වරහන් තුළ වි.ගැ.හි දශ ලක්ෂ)

| ශීර්ෂය | 1987 | 1988 | 1989(අ) | 1990(ආ) |
|---|---|---|---|---|
| වෙළෙඳ භාණ්ඩ (ශුද්ධ) .. | – 20,005<br>(– 525) | – 24,268<br>(– 568) | – 24,050<br>(– 530) | – 28,124<br>(– 518) |
| සාධක නොවන සේවා (ශුද්ධ) .. | 74<br>(2) | 382<br>(8) | 129<br>(1) | 2,902<br>(53) |
| සාධක සේවා (ශුද්ධ) .. | – 4,699<br>(– 123) | – 5,266<br>(– 122) | – 5,738<br>(– 124) | – 5,942<br>(– 109) |
| පෞද්ගලික සංක්‍රාම (ශුද්ධ) .. | 9,226<br>(242) | 10,187<br>(238) | 18,840<br>(258) | 14,813<br>(274) |
| නිල සංක්‍රාම (ශුද්ධ) .. | 5,311<br>(139) | 6,583<br>(154) | 6,751<br>(147) | 6,698<br>(123) |
| ජංගම ගිණුමේ ශේෂය .. | – 10,093<br>(– 265) | – 12,377<br>(– 290) | – 11,069<br>(– 248) | – 9,653<br>(– 177) |
| සමස්ත ශේෂය .. | – 1,224<br>(– 62) | – 3,339<br>(– 64) | – 1,905<br>(– 67) | 6,998<br>(130) |
| **ප්‍රධාන දර්ශක සමහරක්** | | | | |
| වෙළෙඳ අනුපාතය (1981 = 100) | 114 | 106 | 99 | 89 |
| ශුද්ධ ඛණිජ තෙල් ආනයන .. | 6,124<br>(161) | 5,574<br>(130) | 6,134<br>(133) | 10,393<br>(191) |
| ජංගම ගිණුමේ හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් .. | 5·1 | 5·6 | 4·4 | 3·0 |
| දළ ජාත්‍යන්තර සංචිත .. | 18,479<br>(423) | 19,025<br>(426) | 23,390<br>(447) | 34,271<br>(599) |
| ජාත්‍යන්තර සංචිත වලින් කළ හැකි ආනයන මාස ගණන .. | 3·2 | 3·1 | 3·1 | 3·6 |

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

ගෙවුම් ශේෂ දත්තයනට අනුව, සේවා ගිණුමේ හිඟය 1989 දී වි.ගැ.හි. දශ ලක්ෂ 123 (රුපියල් දශ ලක්ෂ 5,609) සිට 1990 දී වි.ගැ.හි. දශ ලක්ෂ 56 (රුපියල් දශ ලක්ෂ 3,040) දක්වා සැළකිය යුතු අඩුවීමක් වාර්තා කරනු ලැබින. 1990 වසරේ සේවා ගිණුමේ වර්ධනයට දායකවූයේ සංචාර, වරාය, ප්‍රවාහන හා රක්ෂණ සහ ආයෝජන ආදායම් යන කාණ්ඩවල ශුද්ධ විදේශ විනිමය ඉපැයුම් ඉහළ යාමයි. සංචාරක අංශයේ දළ විදේශ විනිමය ලැබීම් 1989 දී වි.ගැ.හි. දශ ලක්ෂ 59 සිට 1990 දී වි.ගැ.හි. දශ ලක්ෂ 102 දක්වා සියයට 73 කින් වැඩිවිය. මෙම වැඩිවීම ප්‍රධාන වශයෙන්ම සංචාරක ව්‍යාපාරය යථා තත්ත්වයට පත්වීමේ ප්‍රතිඵලයක් වූ අතර, එය 1990 වර්ෂයේ සංචාරක පැමිණීම සියයට 60 කින් ඉහළ යාමෙන් පිළිබිඹු වේ. සංචාරක ව්‍යාපාරයේ ශුද්ධ ලැබීම් සත් ගුණයකට වඩා වැඩිවීමක් පෙන්නුම් කරමින් 1989 දී වි.ගැ.හි. දශ ලක්ෂ 6 සිට 1990 දී වි.ගැ.හි. දශ ලක්ෂ 44 ක් විය. මගී ගාස්තු ලැබීම් ඉහලයාම හේතුවෙන් වරාය, ප්‍රවාහනය හා රක්ෂණ අංශයේ 1989 දී වාර්තා වූ, වි.ගැ.හි. දශ ලක්ෂ 8 ක හිඟයට ප්‍රතිවිරුද්ධව 1990 වර්ෂයේදී වි.ගැ.හි. දශ ලක්ෂ 8 ක අතිරික්තයක් වාර්තා විය. ලාභ හා ලාභාංශ ගෙවීම් අදාළ දෙවසර තුළදී වි.ගැ.හි. දශ ලක්ෂ 14 සිට වි.ගැ.හි. දශ ලක්ෂ 20 දක්වා වැඩි වුවද, ආයෝජන ආදායම් සම්බන්ධයෙන් වූ ශුද්ධ විදේශ විනිමය ගෙවීම් 1989 දී වි.ගැ.හි. දශ ලක්ෂ 124 සිට 1990 දී වි.ගැ.හි දශ ලක්ෂ 109 දක්වා සියයට 12 කින් අඩු විය. මෙයට හේතු වූයේ මෙරට විදේශ වත්කම් තත්ත්වයේ වූ යහපත් තත්ත්වය හේතුවෙන් විවිධ ආයෝජනවලින් වූ පොළී ලැබීම් සැළකිය යුතු ලෙස වැඩිවීම සහ කෙටිකාලීන විදේශ ණය අඩුවීම හේතුවෙන් පොළී ගෙවීම්වල කැපී පෙනෙන අඩුවීමයි.

නිල සංක්‍රාම අඩුවීම හේතුවෙන්, සංක්‍රාම වෙතින් වූ මුළු ශුද්ධ ලැබීම් 1989 දී වි.ගැ.හි. දශ ලක්ෂ 405 (රුපියල් දශ ලක්ෂ 21,511) සිට 1990 දී වි.ගැ.හි. දශ ලක්ෂ 397 (රුපියල් දශ ලක්ෂ 18,591) දක්වා සුළු වශයෙන් අඩුවිය. 1990 වසරේදී ශුද්ධ පෞද්ගලික සංක්‍රාම වි.ගැ.හි. දශ ලක්ෂ 274 (රුපියල් දශ ලක්ෂ 14,813) දක්වා සියයට 6 කින් වැඩිවිය. ඉරාකය විසින් කුවේටය ආක්‍රමණය කිරීම නිසා සේවා ප්‍රේෂණ තියුණු ලෙසින් අඩුවේයයි මුලදී පැවති බිය දුරුකරමින් පෞද්ගලික සංක්‍රාම වල විශාලතම කොටසක් වන සේවා ප්‍රේෂණ 1989 දී වි.ගැ.හි. දශ ලක්ෂ 279 (රුපියල් දශ ලක්ෂ 12,830) සිට 1990 දී වි.ගැ.හි. දශ ලක්ෂ 297 (රුපියල් දශ ලක්ෂ 16,071) දක්වා සැළකිය යුතු ලෙස වර්ධනය විය. මැද පෙරදිග පැවති අර්බුදකාරී තත්ත්වයට ප්‍රතිචාරයක් ලෙස, එම රටවල සිටින සේවා නියුක්තිකයන් සිය ඉපැයීම් මෙරටට එවීම ඉක්මන් කිරීම මෙම වර්ධනයට ආංශික වශයෙන් හේතු විය. කෙසේ වුවද, නිල සංක්‍රාම 1989 දී වි.ගැ.හි. දශ ලක්ෂ 147 (රුපියල් දශ ලක්ෂ 6,751) සිට 1990 දී වි.ගැ.හි. දශ ලක්ෂ 123 (රුපියල් දශ ලක්ෂ 6,698) දක්වා අඩුවිය.

1989 වර්ෂයේ ජංගම ගිණුමේ හිඟය වූ වි.ගැ.හි. දශ ලක්ෂ 248 (රුපියල් දශ ලක්ෂ 11,069) හා සසඳා බලන කල 1990 දී එම ගිණුමේ හිඟය වි.ගැ.හි. දශ ලක්ෂ 177 (රුපියල් දශ ලක්ෂ 9,653) ක්ව පැවතිණි. මෙය පසුගිය වසර හය තුළ වාර්තා වූ අඩුම හිඟයයි. දළ ජාතික නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස මෙම හිඟය ඉකුත් වසරේදී සියයට 4.4 සිට 1990 දී සියයට 3.0 දක්වා අඩුවූ අතර, 1984 දී ඇතිවූ තේ උත්පාතයෙන් පසු වාර්තා වූ අඩුම මට්ටම මෙය විය. නිල ප්‍රදාන අත්හල විට 1990 දී මෙම අනුපාතය සියයට 5.1 දක්වා ප්‍රතිශත අංක දෙකකින් අඩු විය. ජංගම ගිණුමේ හිඟයෙහි ඇතිවූ මෙම කැපී පෙනෙන අඩුවීම, 1990 වර්ෂයේදී ගෙවුම් තුලන වර්ධනයන්හි දක්නට ලැබුණු විශිෂ්ටතම ලක්ෂණය විය.

ගෙවුම් ශේෂයේ ප්‍රාග්ධන ගිණුමේ ඇතිවූ වර්ධනයන් 1989 ට වඩා 1990 දී සතුටුදායක විය. ප්‍රධාන වශයෙන් මධ්‍යම රජයේ විදේශීය ණය ප්‍රයෝජනයට ගැනීම ඉහළ ගිය නිසා 1990 දී ශුද්ධ මූල්‍ය නොවන ප්‍රාග්ධන ගලාඒම් වි.ගැ.හි. දශ ලක්ෂ 297 දක්වා සියයට 38 කින් වැඩිවිය. පෞද්ගලික සෘජු ආයෝජන වශයෙන් වූ ශුද්ධ ප්‍රාග්ධන ගලාඒම් 1989 දී වි.ගැ.හි. දශ ලක්ෂ 14 සිට 1990 දී වි.ගැ.හි. දශ ලක්ෂ 15 දක්වා සුළු වශයෙන් වැඩිවිය. පසුගිය ණය පියවීම් නිසා ඉකුත් වර්ෂයේදී මෙන්ම, පෞද්ගලික අංශයේ ණය ප්‍රාග්ධන හේතුකොටගෙන ශුද්ධ ප්‍රාග්ධන ගලායාමක් පැවතිණි. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හැරුණු විට පෞද්ගලික අංශයේ සාමාන්‍ය වෙළෙඳ ණය උපයෝජනය අඩුවූ නිසා පෞද්ගලික අංශයේ කෙටිකාලීන ශුද්ධ ණය උපයෝජනය 1989 දී වි.ගැ.හි. දශ ලක්ෂ 72 සිට 1990 දී වි.ගැ.හි. දශ ලක්ෂ 49 දක්වා අඩුවිය.

විශාල ලෙස විදේශීය ණය ගැනීම් වැඩිවීම සහ ණය ආපසු ගෙවීම් අඩුවීම නිසා රජයේ මූල්‍ය නොවන ශුද්ධ ප්‍රාග්ධන ගලාඒම 1990 දී වි.ගැ.හි. දශ ලක්ෂ 264 (රුපියල් දශ ලක්ෂ 14,498) දක්වා සියයට 56 කින් ඉහළ නැගිණි. දළ විදේශීය ණය ලැබීම් සියයට 22 කින්, වි.ගැ.හි. දශ ලක්ෂ 356 (රුපියල් දශ ලක්ෂ 19,545) දක්වා 1990 දී වැඩිවූ අතර, ප්‍රධාන වශයෙන් සහනදායි නොවන ණය ආපසු ගෙවීම අඩුවීමේ හේතුවෙන් ණය ආපසු ගෙවීම් සියයට 25 කින් වි.ගැ.හි. දශ ලක්ෂ 92 දක්වා දෙවසර තුළදී අඩු විය. ව්‍යුහාත්මක ගැලපීම් උදෙසා ආසියානු සංවර්ධන බැංකුවෙන් සහ ජාත්‍යන්තර සංවර්ධන ආයතනය මගින් ලැබුණු වි.ගැ.හි. දශ ලක්ෂ 66 ක ගෙවුම් තුලන ආධාර ණය ප්‍රමාණයක් ද මුළු ණය ගැනීම් ප්‍රමාණයට ඇතුළත් විය.

1990 වසරේ ගෙවුම් ශේෂ තත්ත්වයේ ඇතිවූ යහපත් වර්ධනයන් රටේ විදේශ විනිමය සංචිත ශක්තිමත් කිරීමට උපකාරි විය. සමස්තයක් වශයෙන් ගත්කල 1990 දී දළ නිල සංක්‍රාම වි.ගැ.හි. දශ ලක්ෂ 79 (රුපියල් දශ ලක්ෂ 5,645) කින් වැඩි වූ අතර, 1989 දී එහි වැඩිවීම වි.ගැ.හි. දශ ලක්ෂ 17 (රුපියල් දශ ලක්ෂ 2,494) ක් විය. එමෙන්ම 1989 වර්ෂයේ අවසානයේ වි.ගැ.හි. දශ ලක්ෂ 447 (රුපියල් දශ ලක්ෂ 23,390) ක් වූ රටේ මුළු දළ විදේශ වත්කම් ප්‍රමාණය 1990

අවසානයේදී වි.ගැ.හි. දශ ලක්ෂ 599 (රුපියල් දශ ලක්ෂ 34,271) දක්වා වි.ගැ.හි. දශ ලක්ෂ 152 (රුපියල් දශ ලක්ෂ 10,881) කින් වැඩි විය. මෙම දළ සංචිත මට්ටම 1991 වර්ෂයේ මාස 3.6 ක් සඳහා පුරෝකථනය කරන ලද ආනයන වියදම් පියවීමට ප්‍රමාණවත් වේ.

1990 දී ශ්‍රී ලංකා රුපියලේ අගය සියලුම ප්‍රධාන මුදල් වර්ගවලට ප්‍රතිමුඛව පහත වැටිණි. ඉන්දියානු රුපියලට ප්‍රතිමුඛව පමණක් ශ්‍රී ලංකා රුපියල සියයට 5.7 කින් ඉහළ ගිය අතර ජපන් යෙන්, ඩොයිෂ් මාර්ක්, ප්‍රංශ ප්‍රැන්ක් සහ එක්සත් රාජධානි පවුමට ප්‍රතිමුඛව පිළිවෙලින් සියයට 4.3, සියයට 9.4, සියයට 10.1 සහ සියයට 14.0 කින් ශ්‍රී ලංකා රුපියලේ අගය පහත වැටිණි. විනිමය ගනුදෙනුවලට මැදිහත්වන මුදල් වර්ගය වූ එක්සත් ජනපද ඩොලරයට එරෙහිව රුපියල සියයට 0.6 කින් සුළු වශයෙන් පහත වැටිණි. වි.ගැ.හි. වලට ප්‍රතිමුඛව රුපියල 1990 වර්ෂය තුළ සියයට 7.5 කින් පහත වැටුණු අතර, ඉකුත් වසරේදී මෙම පිරිහීම සියයට 16.3 ක් විය.

වසර තුළදී වි.ගැ.හි. දශ ලක්ෂ 203 ක වැඩිවීමක් පෙන්නුම් කරමින් 1990 වසර අවසානයේදී ශ්‍රී ලංකාවේ නොපියවා පැවති මුළු විදේශීය ණය ප්‍රමාණය වි.ගැ.හි. දශ ලක්ෂ 4,162 ක් ලෙස ගණන් බලා ඇත. මධ්‍යම සහ දිගුකාලීන ණය, මුළු ණය ප්‍රමාණයෙන් සියයට 92 ක් විය. පසුගිය වර්ෂය අවසාන වනවිට වි.ගැ.හි. දශ ලක්ෂ 275 ක් වූ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ගෙවිය යුතුව තිබූ ණය ප්‍රමාණය හා සසඳා බලන විට 1990 වසරේදී එය වි.ගැ.හි. දශ ලක්ෂ 288 ක් විය. මෙයට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ව්‍යුහාත්මක ගැලපුම් පහසුකම් වැඩපිළිවෙල යටතේ තෙවැනි සහ අවසන් වාරිකය වශයෙන් ලද වි.ගැ.හි. දශ ලක්ෂ 44.5 ක් ද ඇතුළත් විය. 1990 දී නොපියවූ කෙටිකාලීන ණය මට්ටමෙහි සුළු අඩුවීමක් වාර්තා කරනු ලැබීන.

1990 වර්ෂයේදී ගෙවුම් තුලන තත්වයෙහි වඩාත් අභිමත වර්ධනය වූයේ ණය සේවාකරණ පිරිවැයෙහි වූ තියුණු අඩුවීමය. මධ්‍ය හා දිගුකාලීන ණය ආපසු ගෙවීම් හා සියළුම විදේශීය ණය සඳහා වූ පොලී ගෙවීම් ඇතුළත් ණය සේවාකරණ ගෙවීම් වි. ගැ. හි. දශ ලක්ෂ 69 කින් පහත වැටෙමින් 1990 දී වි. ගැ. හි. දශ ලක්ෂ 306 ක් බවට පත් විය. ණය සේවාකරණ ගෙවීම්වල අඩුවීම හා අපනයන ඉපැයීම්වල වැඩිවීම පිළිබිඹු කරමින් ණය සේවාකරණ ගෙවීම්, භාණ්ඩ හා සේවා අපනයන ඉපැයීම්වල අනුපාතයක් වශයෙන් ගත්කල 1989 දී සියයට 24.6 සිට 1990 දී සියයට 16.5 දක්වා පහත වැටිණි. භාණ්ඩ හා සේවා අපනයන ලැබීම් සහ පෞද්ගලික පැවරුම්වල අනුපාතයක් වශයෙන් ණය සේවාකරණ ගෙවීම්, 1989 දී පැවති සියයට 20.8 සමඟ සැසඳීමේදී 1990 දී සියයට 14.2 ක් විය.

1990 දී රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති තුළින් අයවැය හිඟය දැරිය හැකි මට්ටමක පවත්වා ගැනීමට අඛණ්ඩව දරන ලද ප්‍රයත්නයක් පිළිබිඹු විය. ක්‍රියාත්මක වෙමින් පවතින ස්ථායීකරණ වැඩපිළිවෙලෙහි ඉලක්ක කරන ලද පරිදි සමස්ත අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 10 කට සීමාකර ගනු ලැබිණ. ආදායම් රැස්කිරීමේ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම සහ වියදම් අඩු කිරීම අරමුණු කොටගත් නව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තීන්, 1990 දී අයවැය හිඟය හා අදාළ ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේදී සැළකිය යුතු ලෙසින් ආධාර විය. 1990 දී සියයට 21.2 ක්ව පැවති ආදායම්/දළ දේශීය නිෂ්පාදන අනුපාතය මෑත අවුරුදුවලදී ඉහළ ආදායම් ඉලක්ක පවත්වා ගැනීම සඳහා දරන ලද ප්‍රයත්නයන් පිළිබිඹු කරන ලදී. වැඩිදියුණු කරන ලද ආදායම් ප්‍රයත්නයන් පවත්වා ගන්නා අතරම වර්තන වියදම්/දළ දේශීය නිෂ්පාදන අනුපාතය ඉකුත් වර්ෂයේදී පැවති සියයට 22.6 ක ප්‍රමාණය 1990 දී සියයට 22.4 දක්වා අඩුකර ලීමට රජය සමත් විය.

රාජ්‍ය ආයෝජනයන්හි තවදුරටත් කෙරුනු ගැලපීම් පිළිබිඹු කරමින් දළ දේශීය නිෂ්පාදිතයට අනුපාතිකව ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණයදීම් ප්‍රමාණය 1989 දී සියයට 10 සිට 1990 දී සියයට 8.8 දක්වා තවදුරටත් පහත වැටිණි. මේ අනුව සමස්ත රජයේ වියදම්/දළ දේශීය නිෂ්පාදන අනුපාතය 1989 දී සියයට 32.6 සිට 1990 දී සියයට 31.1 දක්වා අඩු වුණි. අයවැය හිඟය අඩුකර ගැනීමේ අරමුණ ඉටුකර ගැනීමේදී කරනු ලැබූ ආදයම් හා වියදම් ගැලපීම් හැරුනුවිට, හිඟය පියවීමේ අංශයෙන්ද යහපත් උපනතියක් දක්නට ලැබින. මේ අනුව, ප්‍රසාරණාත්මක බැංකු ණය ලබාගැනීමේ අවශ්‍යතාවය ඉවත් කරමින්, දේශීය මූලාශ්‍රයන්ගෙන් හිඟය පියවීම සඳහා අවශ්‍ය සම්පත් මුළුමනින්ම දේශීය බැංකු නොවන මූලාශ්‍රයන්ගෙන් ලබාගනු ලැබින.

1990 වර්ෂයේදී සියයට 26 ක වර්ධනයක් වාර්තා කරමින් රජයේ ආදයම රුපියල් දශ ලක්ෂ 67,964 ක් විය. එසේ වුවද, ආදයම දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව, 1989 දී සියයට 21.4 සිට 1990 දී සියයට 21.2 දක්වා සුළු වශයෙන් පහත වැටිණි. ප්‍රධාන ආදයම් ප්‍රභවයන්හි ඉහළ සංවේදීතාවය පිළිබිඹු කරමින් බදු ආදයම/දළ දේශීය නිෂ්පාදන අනුපාතය සියයට 18.9 සිට සියයට 19.1 දක්වා වැඩි විය. මුළු බදු ආදයමින් අඩක් පමණ යැයි ගණන් බලා ඇති දේශීය භාණ්ඩ හා සේවා මත පනවන ලද බදු ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 28,770 ක් වූ අතර, එය පසුගිය වර්ෂයට වඩා සියයට 38 කින් වැඩි විය. මේ අතර ජාත්‍යන්තර වෙළෙඳාම මත පදනම් වූ බදු ආදයම 1990 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 19,341 ක්වූ අතර, එය මුළු බදු ආදයමින් තවත් සියයට 32 කට දයක විය. ආදයම් බදු හා දේපල ගණුදෙනු මත වූ බදු රුපියල් දශ ලක්ෂ 10,477 ක් වූ අතර, එය 1989 වර්ෂයේ පැවති සියයට 22 ක වර්ධනය හා සසඳන කල සියයට 34 ක වැඩිවීමක් පෙන්වීය.

වියදම් අංශයෙන් සළකා බලන කල 1990 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 50,959 ක්වූ පොළී ගෙවීම්, කුටුම්භ පැවරුම් සහ භාණ්ඩ හා සේවා මත කරන ලද වියදම් නොකඩවා වැඩිවන පීඩනයක් පෙන්වනු ලැබිනා. රජයේ ණය මත කළ රුපියල් දශ ලක්ෂ 20,668 ක්වූ පොළී ගෙවීම් මුළු වර්තන වියදම් වලින් සියයට 30 ක් පමණ වූ අතර, එය සියයට 44 ක වර්ධනයක් පෙන්වීය. එසේම, කුටුම්භ පැවරුම් රුපියල් දශ ලක්ෂ 15,872 ක්ද ඇතුලත් වූ පැවරුම් ගෙවීම්, 1990 දී සියයට 23 ක වැඩිවීමක් පෙන්වමින් රුපියල් දශ ලක්ෂ 20,936 ක් විය. රුපියල් දශ ලක්ෂ 15,749 ක් වූ රජයේ වේතන බිල සියයට 9 ක සාමාන්‍ය වැඩිවීමක් පමණක් වාර්තා කර තිබියදීත්, රුපියල් දශ ලක්ෂ 30,167 ක්වූ භාණ්ඩ හා සේවා සඳහා කළ මුළු වියදම සියයට 18 කින් වැඩි විය. මෙයට බලපෑ ප්‍රධාන හේතුව වූයේ ආරක්ෂක කටයුතු හා අදළ මිළදී ගැනීම් ඇතුලත් වූ අනෙකුත් භාණ්ඩ හා සේවා මිළදී ගැනීම සඳහා වූ වියදම, සියයට 30 කින් වැඩි වීමය. මෙම වැඩිවීම් පිළිබිඹු කරමින්, රුපියල් දශ ලක්ෂ 71,771 ක්වූ වර්තන වියදම්, සියයට 26 ක වර්ධනයක් වාර්තා කළ අතර, එම වර්ධනය නාමික දළ දේශීය නිෂ්පාදිතයේ වූ වර්ධනයට වඩා සුළු වශයෙන් අඩු විය. මේ අනුව වර්තන වියදම්/දළ දේශීය නිෂ්පාදන අනුපාතය 1989 දී සියයට 22.6 සිට 1990 දී සියයට 22.4 දක්වා සුළු වශයෙන් පහත වැටිණි.

ප්‍රාග්ධන වියදම්වල වූ ගැලපුම් වර්තන වියදම්වල ගැලපුම්වලට වඩා තියුණු විය. ප්‍රාග්ධන වියදම් හා ශුද්ධ ණයදීම් රුපියල් දශ ලක්ෂ 28,043 ක්වූ අතර සියයට 11 ක නාමික වැඩිවීමක් පෙන්නුම් කළේය. මේ අනුව ප්‍රාග්ධන වියදම්/දළ දේශීය නිෂ්පාදන අනුපාතය 1989 දී සියයට 10.0 සිට 1990 දී සියයට 8.8 දක්වා පහත වැටිණි. ප්‍රාග්ධන වියදම්හි වූ මෙම පහත වැටීම ප්‍රධාන වශයෙන් විදේශීය අරමුදල් යටතේ මූල්‍යනය කළ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී මතු වූ ගැටළු හේතුකොටගෙන ඇති වූවකි.

1990 දී රාජ්‍ය මූල්‍ය කටයුතු සඳහා වූ සමස්ත ආදයම් හා වියදම් ප්‍රවාහයන්ගේ ප්‍රතිඵලයක් ලෙස අයවැය හිඟය (දීමනාවලට පෙර) රුපියල් දශ ලක්ෂ 31,850 විය. එය, පසුගිය වසරෙහි වාර්තාගත අයවැය හිඟය වූ රුපියල් දශ ලක්ෂ 28,185 ට වඩා සියයට 13 ක වැඩිවීමකි. ණය හා දීමනා වශයෙන් විදේශීය ප්‍රභවයන්ගෙන් ලැබුණු අරමුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ

පුස්තකාලය
මොරටුව විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව
මොරටුව.



## 1.4 සංඛ්‍යා සටහන

### රාජ්‍ය මූල්‍ය කටයුතු පිළිබඳ සම්පිණ්ඩනය

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | 1986 | 1987 | 1988 | 1989 | 1990 අනුමත කළ ඇස්තමේන්තු | 1990 තාවකාලික | 1991 අනුමත කළ ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|---|---|
| මුළු ආදයම සහ දීමනා .. | 40,991 | 46,822 | 48,337 | 60,386 | 68,062 | 74,662 | 79,529 |
| මුළු ආදයම .. | 37,238 | 42,145 | 41,749 | 53,979 | 61,262 | 67,964 | 71,529 |
| බදු .. | 31,272 | 35,119 | 35,946 | 47,513 | 55,920 | 61,206 | 64,899 |
| බදු නොවන .. | 5,966 | 7,026 | 5,803 | 6,466 | 5,342 | 6,758 | 6,630 |
| දීමනා .. | 3,753 | 4,677 | 6,588 | 6,407 | 6,800 | 6,697 | 8,000 |
| වියදම සහ ආපසු ගෙවීම | | | | | | | |
| අඩුකළ පසු ණය දීම .. | 59,193 | 63,894 | 76,532 | 82,164 | 89,861 | 99,814 | 107,551 |
| වර්තන .. | 33,966 | 39,560 | 46,132 | 56,884 | 63,561 | 71,771 | 72,962 |
| ප්‍රාග්ධන .. | 23,236 | 22,816 | 22,878 | 20,750 | 21,653 | 19,161 | 28,118 |
| ආපසු ගෙවීම් අඩුකළ පසු ණයදීම .. | 1,991 | 1,518 | 7,522 | 4,530 | 4,647 | 8,882 | 6,471 |
| වර්තන ගිණුම් අතිරික්තය/හිඟය (–) .. | 3,272 | 2,585 | – 4,383 | – 2,905 | – 2,299 | – 3,807 | – 1,433 |
| අයවැය හිඟය (දීමනා වලට පෙර) .. | –21,956 | –21,749 | –34,783 | –28,185 | –28,599 | –31,850 | –36,022 |
| අයවැය හිඟය (දීමනා වලට පසු) .. | –18,203 | –17,072 | –28,195 | –21,778 | –21,799 | –25,153 | –28,022 |
| පියවීම .. | 18,203 | 17,072 | 28,195 | 21,778 | 21,799 | 25,153 | 28,022 |
| විදේශීය ණය ගැනීම .. | 9,061 | 5,716 | 7,128 | 5,926 | 10,558 | 11,644 | 19,883 |
| දේශීය ණය ගැනීම .. | 9,142 | 11,356 | 21,067 | 15,852 | 11,241 | 13,509 | 8,139 |
| වෙළෙඳපොල නොවන (අ) .. | – 669 | 1,415 | 1,687 | 5,301 | — | 60 | — |
| වෙළෙඳපොල .. | 9,811 | 9,941 | 19,380 | 10,551 | 11,241 | 13,448 | 8,139 |
| බැංකු නොවන .. | 6,765 | 6,400 | 9,227 | 13,837 | 10,199 | 13,074 | 12,639 |
| බැංකු .. | 3,047 | 3,541 | 10,153 | – 3,286 | 1,042 | 373 | – 4,500 |

දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන්

| ශීර්ෂය | 1986 | 1987 | 1988 | 1989 | 1990 අනුමත කළ ඇස්තමේන්තු | 1990 තාවකාලික | 1991 අනුමත කළ ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|---|---|
| මුළු ආදයම සහ දීමනා .. | 22·8 | 23·8 | 21·8 | 24·0 | 24·0 | 23·3 | 21·7 |
| මුළු ආදයම .. | 20·7 | 21·4 | 18·8 | 21·4 | 21·6 | 21·2 | 19·5 |
| බදු .. | 17·4 | 17·9 | 16·2 | 18·9 | 19·7 | 19·1 | 17·7 |
| බදු නොවන .. | 3·3 | 3·6 | 2·6 | 2·6 | 1·9 | 2·1 | 1·8 |
| දීමනා .. | 2·1 | 2·4 | 3·0 | 2·5 | 2·4 | 2·1 | 2·2 |
| වියදම සහ ආපසු ගෙවීම | | | | | | | |
| අඩුකළ පසු ණයදීම .. | 33·0 | 32·5 | 34·5 | 32·6 | 31·7 | 31·1 | 29·3 |
| වර්තන .. | 18·9 | 20·1 | 20·8 | 22·6 | 22·4 | 22·4 | 19·9 |
| ප්‍රාග්ධන .. | 13·0 | 11·6 | 10·3 | 8·2 | 7·6 | 6·0 | 7·7 |
| ආපසු ගෙවීම් අඩුකළ පසු ණයදීම .. | 1·1 | 0·8 | 3·4 | 1·8 | 1·6 | 2·8 | 1·8 |
| වර්තන ගිණුම් අතිරික්තය/හිඟය (–) .. | 1·8 | 1·3 | –2·0 | – 1·2 | – 0·8 | – 1·2 | – 0·4 |
| අයවැය හිඟය (දීමනා වලට පෙර) .. | –12·2 | –11·1 | –15·7 | –11·2 | – 10·1 | – 9·9 | – 9·8 |
| අයවැය හිඟය (දීමනා වලට පසු) .. | –10·1 | – 8·7 | –12·7 | – 8·6 | – 7·7 | – 7·8 | – 7·6 |
| පියවීම .. | 10·1 | 8·7 | 12·7 | 8·6 | 7·7 | 7·8 | 7·6 |
| විදේශීය ණය ගැනීම .. | 5·0 | 2·9 | 3·2 | 2·4 | 3·7 | 3·6 | 5·4 |
| දේශීය ණය ගැනීම .. | 5·1 | 5·8 | 9·5 | 6·3 | 4·0 | 4·2 | 2·2 |
| වෙළෙඳපොල නොවන .. | – 0·4 | 0·7 | 0·8 | 2·1 | — | — | — |
| වෙළෙඳපොල .. | 5·5 | 5·1 | 8·7 | 4·2 | 4·0 | 4·2 | 2·2 |
| බැංකු නොවන .. | 3·8 | 3·3 | 4·2 | 5·5 | 3·6 | 4·1 | 3·4 |
| බැංකු .. | 1·7 | 1·8 | 4·6 | – 1·3 | 0·4 | 0·1 | – 1·2 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) 1989 හිඟ වියදම් වැඩිවීම් වෙනුවෙන් රුපියල් දශ ලක්ෂ 3,478 ක්ද, 1990 හිඟ වියදම් අඩුවීම් වෙනුවෙන් රුපියල් දශ ලක්ෂ 2,107 ක්ද, ගැලපුම් කර ඇත.

55558

18,341 ක් වූ අතර, එය අයවැය හිඟය පියවීම සඳහා අවශ්‍ය මුළු සම්පත් ප්‍රමාණයෙන් ආසන්න වශයෙන් සියයට 60 ක් නියෝජනය කරනු ලැබින. පෙර වර්ෂයේ එම ප්‍රමාණය සියයට 44 ක් විය. එසේ වුවද, 1990 දී රුපියල් දශ ලක්ෂ 15,616 ක්වූ දේශීය ණයගැනීම් සියයට 26 ක වැඩිවීමක් වාර්තා කළ අතර පෙර වර්ෂයෙන් ඉතිරිවූ රුපියල් දශ ලක්ෂ 2,107 ක වගකීම මෙම වැඩිවීම කෙරෙහි බලපෑ ප්‍රධාන හේතුව විය. දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව දේශීය ණය ගැනීම් පෙර වර්ෂයේ පැවති සියයට 4.9 මට්ටමෙහිම පැවතිණි. 1990 වර්ෂයේ අයවැය හිඟය මූල්‍යකරණයේදී දක්නට ලැබුණු වැදගත් ලක්ෂණය වූයේ දේශීය ණය අවශ්‍යතාවයන් මුළුමනින්ම පාහේ දේශීය බැංකු නොවන අංශයෙන් එක්රැස් කරගත හැකිවීමය. මේ අනුව, බැංකු ක්‍රමයෙන් ලබා ගත් ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 374 ක අවම මට්ටමක පැවතීම නිසා, 1990 වර්ෂයේ අයවැය කටයුතු මූල්‍ය ප්‍රසාරණය කෙරෙහි පීඩනයක් ඇති නොකළේය.

1990 අවසානයේදී නොපියවූ රාජ්‍ය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 310,780 ක් විය. මෙය පසුගිය වර්ෂයේ නොපියවා පැවති ණය ප්‍රමාණයට වඩා සියයට 13 ක වැඩිවීමකි. මුළු ණය ප්‍රමාණයෙන් දේශීය ණය සියයට 14 ක වැඩිවීමක් වාර්තා කරමින් රුපියල් දශ ලක්ෂ 133,897 ක් වූ අතර සියයට 13 ක වැඩිවීමක් වාර්තා කළ විදේශීය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 176,883 ක් විය. 1990 වර්ෂය අවසානයේදී මැදි හා දිගුකාලීන දේශීය ණය රුපියල් දශ ලක්ෂ 59,454 ක්ව සියයට 9 ක වැඩිවීමක් පෙන්නුම් කළ අතර, රුපියල් දශ ලක්ෂ 74,444 ක් වූ කෙටිකාලීන ණය සියයට 18 ක වර්ධනයක් වාර්තා කළේය. රාජ්‍ය ණය සංයුතියෙහි ඇතිවූ මෙම වෙනස්කම් පිළිබිඹු කරමින් 1989 දී මුළු දේශීය ණය ප්‍රමාණයෙන් සියයට 54 ක්වූ කෙටිකාලීන ණය 1990 දී සියයට 56 දක්වා ඉහළ නැගිණි.

භාණ්ඩාගාර බිල්පත් නිකුතුවෙන් එකතු කරන ලද සම්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 10,437 ක් වූ අතර, ඉන් රුපියල් දශ ලක්ෂ 7,401 ක් බැංකු නොවන මූලාශ්‍රයන්ගෙන් ලැබිණි. 1990 අවසානය වනවිට නොපියවූ භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 67,968 ක් වූ අතර එය 1989 වර්ෂය අවසානයේ වූ රුපියල් දශ ලක්ෂ 57,246 සමඟ සැසඳිය හැක. භාණ්ඩාගාර බිල්පත් මතවූ නොපියවූ වගකීම් ප්‍රමාණය වැඩි වූ අතර මහ බැංකුව විසින් දරන ලද භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය, 1989 අවසානයේදී රුපියල් දශ ලක්ෂ 34,098 සිට 1990 අවසානය වනවිට රුපියල් දශ ලක්ෂ 30,654 දක්වා අඩු විය. මේ අනුව මෙම වර්ෂ දෙක තුළදී භාණ්ඩාගාර බිල්පත් වලින් මහ බැංකුව විසින් දරන ලද කොටස, සියයට 60 සිට සියයට 45 දක්වා සීඝ්‍ර ලෙස පහත වැටිණි. 1990 වර්ෂයේදී අයවැය කටයුතු සඳහා රුපියල් දශ ලක්ෂ 8,314 ක් රුපියල් ණය මගින් ලබා ගන්නා ලදී. එසේ වුවද, රුපියල් දශ ලක්ෂ 8,212 ක ණය ආපසු ගෙවීම හේතුකොටගෙන රුපියල් සුරැකුම් මත වූ නොපියවූ ණය ප්‍රමාණය වැඩිවූයේ රුපියල් දශ ලක්ෂ 460 කින් පමණි. මේ අතර 1990 දී හඳුන්වා දෙන ලද ජාතික ආරක්ෂක බැඳුම්කර මගින් රුපියල් දශ ලක්ෂ 4,532 ක් ලබා ගන්නා ලදී. භාණ්ඩාගාර බිල්පත්, රුපියල් සුරැකුම් සහ ජාතික ආරක්ෂක බැඳුම්කර මිලදී ගැනීම සඳහා ප්‍රධාන වශයෙන් සේවක අර්ථසාධක අරමුදල, ජාතික ඉතිරි කිරීමේ බැංකුව, සේවක භාරකාර අරමුදල සහ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව දයක විය.

පසුගිය වසරේ නොපියවා පැවති රුපියල් දශ ලක්ෂ 156.298 සමඟ සසඳන කල 1990 අවසානයේදී නොපියවූ විදේශ ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 176,883 ක් විය. වර්ෂය තුළ අයවැය කටයුතු සඳහා ලබාගන්නා ලද ශුද්ධ විදේශීය ණය ගැනීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 11,644 ක් වුවද, විනිමය අනුපාතිකයේ විචලනයෙන් ඇති වූ රුපියල් දශ ලක්ෂ 8,508 ක අමතර වගකීම නිසා නොපියවූ විදේශ ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 20,585 කින් වැඩිවිය. වර්ෂය අවසානයේ දී වූ විදේශ ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 106,676 ක් වූ ද්විපාර්ශ්වීය ණය වලින් හා රුපියල් දශ ලක්ෂ 59,526 ක් වූ බහුපාර්ශ්වීය ණයවලින් ද සමන්විත විය.

ණය ආපසු ගෙවීම් සහ පොළී ගෙවීම් වලින් සමන්විත රජයේ ණය සේවාකරණ ගෙවීම්, පෙර වසර හා සසඳන කළ සියයට 38 කින් වැඩිවී 1990 වසරේදී රුපියල් දශ ලක්ෂ 32,878 ක් විය. මෙම ඉහළ වර්ධනය පිළිබිඹු කරමින්, ණය සේවාකරණ ගෙවීම් දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස 1989 වසරේ දී සියයට 9.5 සිට 1990 වසරේ දී සියයට 10.2 දක්වා ඉහළ නැගිණි.

මුදල් සැපයුම් වර්ධන අනුපාතයේ වූ කැපී පෙනෙන සීඝ්‍රතාවය, 1990 වසරේ සාර්ව ආර්ථික ප්‍රවණතාවන්හි දක්නට ලැබුණු එතරම් හිතකර නොවූ ලක්ෂණයක් විය. පටු මුදල් සැපයුමේ ($M_1$) වාර්ෂික වර්ධන අනුපාතිකය 1989 වසරේ වූ සියයට 9 හා සසඳන කල 1990 වසරේදී සියයට 13 ක් විය. වඩා තියුණු ඉහළ යාමක් නිරූපනය කරමින් පුළුල් මුදල් සැපයුමේ ($M_2$) වාර්ෂික වර්ධන අනුපාතිකය 1989 වසර අවසානයේදී සියයට 12 සිට 1990 වසර අවසානයේදී සියයට 19 ක් විය. එවකට ක්‍රියාත්මකව පැවති සාර්ව ආර්ථික ස්ථායීකරණ වැඩ පිළිවෙලට අනුකූලව මූල්‍ය සමස්තයන් දෙකෙහිම පහත වැටුණු වර්ධන අනුපාතික දක්නට ලැබුණු 1989 වසරට වඩා 1990 වසරේ මූල්‍ය ප්‍රවණතාවන්හි කැපී පෙනෙන වෙනසක් දක්නට ලැබුණි. මූල්‍ය අංශයට අදළ සාර්ව ආර්ථික ඉලක්කයන්හි ඇතිවූ මෙම අහිතකර වෙනස්වීම වැනි අයහපත් ලක්ෂණයකින් සමන්විතවීම හැරෙන්නට, 1990 වසර තුළ සාර්ව ආර්ථික පසුබිමෙහි සතුටුදයක තත්ත්වයක් මතුවී පෙනිණි.

**1 . 5 සංඛ්‍යා සටහන**

**මූල්‍ය කටයුතු පිළිබඳ සංඛ්‍යා 1984 – 1990**

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | 1984 | 1985 | 1986 | 1987 | 1988 | 1989 | 1990 |
|---|---|---|---|---|---|---|---|
| දේශිය ණයෙහි වෙනස .. | 633 | 9,300 | 4,883 | 11,457 | 21,302 | 5,454 | 17,543 |
| රජයට දෙන ලද ශුද්ධ ණය වැඩිවීම .. | –2,979 | 5,793 | 2,198 | 4,502 | 9,017 | 54 | 3,078 |
| රාජ්‍ය සංස්ථාවලට දෙන ලද ණය වැඩිවීම .. | – 237 | 290 | 301 | 2,627 | 3,421 | 3,075 | 1,774 |
| සමුපකාර ආයතන වලට දෙන ලද ණය වැඩිවීම .. | – 255 | – 263 | 120 | – 301 | 195 | – 140 | 418 |
| අනෙකුත් පෞද්ගලික අංශයට දෙන ලද ණයෙහි වැඩිවීම .. | 4,104 | 3,480 | 2,263 | 4,629 | 8,669 | 2,465 | 12,273 |
| බැංකු විදේශ වත්කම් (ශුද්ධ) වෙනස .. | 6,796 | – 768 | – 3 | 111 | –2,233 | –2,326 | 5,474 |
| මුළු වත්කම් / වගකීම් හි වෙනස .. | 7,429 | 8,532 | 4,880 | 11,568 | 19,069 | 3,128 | 23,017 |
| පුළුල් මුදල් සැපයුම ($M_2$) වැඩිවීම .. | 6,170 | 4,982 | 2,451 | 7,475 | 9,611 | 8,487 | 14,584 |
| අනෙකුත් වගකීම් (ශුද්ධ) වැඩිවීම .. | 1,259 | 3,551 | 2,428 | 4,093 | 9,458 | –5,359 | 8,433 |

මූල්‍ය කටයුතුවල වැඩිවීම ප්‍රතිශතයක් වශයෙන්

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| මුළු දේශීය ණය වැඩිවීම ප්‍රතිශතයක් වශයෙන් .. | 1·3 | 18·6 | 8·2 | 17·9 | 28·2 | 5·6 | 17·1 |
| මුළු වත්කම් / වගකීම් වැඩිවීම ප්‍රතිශතයක් වශයෙන් | 14·2 | 14·2 | 7·1 | 15·8 | 22·4 | 3·0 | 17·7 |
| මුළු දේශීය ණය වැඩිවීමෙන් රාජ්‍ය අංශයේ දයකත්වය ප්‍රතිශතයක් වශයෙන් .. | –470·4 | 62·3 | 45·0 | 39·3 | 42·3 | 0·1 | 17·5 |
| මුළු දේශීය ණය වැඩිවීමෙන් රාජ්‍ය නොවන අංශයේ දයකත්වය ප්‍රතිශතයක් වශයෙන් .. | 570·4 | 37·7 | 55·0 | 60·7 | 57·7 | 99·9 | 82·5 |
| පුළුල් මුදල් සැපයුම ($M_2$) .. | 16·6 | 11·4 | 5·1 | 14·7 | 16·4 | 12·4 | 19·1 |
| පටු මුදල් සැපයුම ($M_1$) .. | 14·1 | 11·5 | 12·9 | 18·4 | 29·1 | 9·1 | 12·8 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

1990 වසර තුළ මුදල් සැපයුමේ සීඝ්‍ර වර්ධනය පුළුල් මුදල් සැපයුම තුළ වඩාත් තිව්‍ර ලෙස දක්නට ලැබිණි. මෙයට හේතු වූයේ ආසන්න මුදල් වර්ධනය සැළකිය යුතු ලෙස ඉහළ යාමය. 1989 වසර තුළ රුපියල් දශ ලක්ෂ 5,528 කින් හෙවත් සියයට 16 කින් සැළකිය යුතු ලෙස ඉහළගිය ආසන්න මුදල් 1990 වසර තුළදී රුපියල් දශ ලක්ෂ 10,044 ක හෙවත් සියයට 24 ක ඉතා විශාල වර්ධනයක් වාර්තා කරනු ලැබින. මෙම වැඩිවීම විශාල වශයෙන් පිළිබිඹු වූයේ රුපියල් දශ ලක්ෂ 9,578 කින් හෙවත් සියයට 27 කින් ඉහළ නැඟුනු අනෙකුත් පෞද්ගලික අංශයේ කාලීන හා ඉතුරුම් තැන්පතු තුළිනි. ආර්ථිකයේ ව්‍යාප්ත වෙමින් පැවති අහිතකර උද්ධමනාත්මක පීඩනයන් මධ්‍යයේ වුවද ආසන්න මුදල්හි සිදුවූ මෙම සුවිශේෂ ඉහළයාම, මෙම වසර තුළවූ සාර්ව ආර්ථික ප්‍රවණතාවන්හි දක්නට ලැබුණු වඩාත් ධෛර්‍යය එළවන සුළු ලක්ෂණයක් ලෙස කැපී පෙනිණි.

මේ අතර මූල්‍ය පදනම (හෙවත් සංචිත මුදල්) 1989 වසරේ වූ රුපියල් දශ ලක්ෂ 1,227 ක හෙවත් සියයට 5 ක සුළු වර්ධනය සමඟ සසඳන විට 1990 වසරේදී රුපියල් දශ ලක්ෂ 4,789 ක හෙවත් සියයට 18 ක ඉහළ යාමක් වාර්තා කළේය. මූලාශ්‍ර අංශයෙන් සළකන කල මෙම ඉහළයාම විශාල වශයෙන් මහ බැංකුවේ ශුද්ධ විදේශ වත්කම් රුපියල් දශ ලක්ෂ 2,997 කින් සැළකියයුතු ලෙස ප්‍රසාරණය වීමේ ප්‍රතිඵලයක් විය. මෙයට සාපේක්ෂව මහ බැංකුවේ දේශීය වත්කම් රුපියල් දශ ලක්ෂ 1,792 කින් වැඩිවිය. මහ බැංකුවේ ශුද්ධ විදේශ වත්කම්වල තියුණු ඉහළයාම, මෙම වසර තුළදී ආසන්න මුදල්වල වූ ඉහළ වර්ධනය ආංශික වශයෙන් පැහැදිලි කරනු ලබයි.

දේශීය ණය වර්ධනයේ වූ විශාල ඉහළ නැඟීම, 1990 වසරේ වූ මුදල් සැපයුම් වර්ධන අනුපාතයේ සීඝ්‍ර ඉහළ යාමට හේතුවූ ප්‍රධාන සාධකය විය. 1989 වසරේ දක්නට ලැබුණු රුපියල් දශ ලක්ෂ 5,454 ක් හෙවත් සියයට 6 ක් වූ මධ්‍යස්ථ වර්ධනයට ප්‍රතිවිරුද්ධව, දේශීය ණය 1990 වසර තුළ රුපියල් දශ ලක්ෂ 17,543 කින් හෙවත් සියයට 17 කින් කැපී පෙනෙන ලෙස වැඩි විය. රාජ්‍ය අංශය මෙන්ම, පෞද්ගලික අංශයද වසර තුළ දේශීය ණය වර්ධනයට දායක වූ නමුත්, ඉන් අති විශාල ප්‍රමාණයක් උපයෝජනය කරන ලද්දේ පෞද්ගලික අංශය විසිනි. සමස්තයක් වශයෙන් ගත් කළ, පෞද්ගලික අංශයේ දළ ණය ප්‍රමාණය 1989 වසරේ වර්ධනය වූ රුපියල් දශ ලක්ෂ 5,400 ක් හෙවත් සියයට 9 ක් සමඟ සසඳන කළ 1990 වසර තුළ රුපියල් දශ ලක්ෂ 14,465 කින් හෙවත් සියයට 22 කින් ඉහළ නැගිණි. මේ අතර, බැංකු අංශය වෙතින් රාජ්‍ය අංශයට දෙන ලද ශුද්ධ ණය ප්‍රමාණය 1989 වසරේ වූ රුපියල් දශ ලක්ෂ 54 ක ඉතා සුළු වැඩිවීමට සාපේක්ෂව 1990 වසර තුළ රුපියල් දශ ලක්ෂ 3,078 කින් හෙවත් සියයට 9 කින් ප්‍රසාරණය විය.

ව්‍යාපාරික වාතාවරණය යහපත් වීමත් සමඟ ආර්ථික කටයුතු යථා තත්වයට පත්වීම, හිතකර දේශගුණික තත්ත්වයන් සහ ඉහළ නැඟුණු විදුලිබල සහ ඛණිජ තෙල් මිළ ගණන් හේතුවෙන් වැඩිවූ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා ආදිය 1990 වසර තුළදී පෞද්ගලික අංශයට දෙන ලද ණය ප්‍රමාණයේ විශාල වර්ධනයට දායක වූ සාධක විය. පෞද්ගලික අංශය තුළ වූ උප අංශ තුනෙහිම ණය උපයෝජනය මෙම වසර තුළදී වර්ධනය විය. වාණිජ බැංකු වෙතින් අනෙකුත් පෞද්ගලික අංශයට සපයන ලද ණය ප්‍රමාණය 1989 වසරේ වූ රුපියල් දශ ලක්ෂ 2,465 ක හෙවත් සියයට 5 ක වර්ධනය හා සසඳන කල 1990 වසරේදී රුපියල් දශ ලක්ෂ 12,273 කින් හෙවත් සියයට 24 කින් ඉහළ නැගිණි. ඉතා දැඩි වූ මූල්‍ය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වෙමින් තිබියදී පවා ඉහළ මට්ටමක පැවතුනු පෞද්ගලික අංශයේ ණය උපයෝජනය මගින් වසර තුළ ආර්ථික කටයුතුවල පැවතුනු වර්ධනය පිළිබිඹු කෙරුණි.

මේ අතර රාජ්‍ය අංශයේ සංස්ථාවලට සපයනු ලැබූ ණය ප්‍රමාණය 1990 දී සියයට 13 කින් හෙවත් රුපියල් දශ ලක්ෂ 1,774 කින් වැඩි වූ අතර මෙම වැඩිවීම, 1989 දී වූ සියයට 29 ක හෙවත් රුපියල් දශ ලක්ෂ 3,075 ක ඉහළ නැගීමක් හා සසඳන කල බෙහෙවින් අඩු වර්ධනයකි. මෙම අංශයේ ප්‍රධාන ණය ගැනුම්කරුවන් වූයේ සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව (ස.තො.ස.),

ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව යන ආයතන වෙ. ස. තො. ස. මගින් ගත් නොපියවූ මුළු බැංකු ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1,224 කින් ඉහළ නැගිණි. ආහාර කොමසාරිස් සතුව තිබූ ආහාර ද්‍රව්‍ය ආනයන පිළිබඳ වගකීම ස. තො. ස. ට පවරා දීමෙන් පසු අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ආනයනකරුවෙකු සහ සම්භාරක තොග පවත්වා ගන්නෙකු වශයෙන් ස. තො. ස. සතු කාර්යභාරය පුළුල්වීම හේතුවෙන් එම ආයතනය බැංකු ක්‍රමය මත දැඩි ඉල්ලුමක් ඇති කරනු ලැබීය. මේ අතර සමුපකාර අංශය වෙතට වූ බැංකු ණය ප්‍රමාණය, 1989 දී වූ රුපියල් දශ ලක්ෂ 140 ක හෙවත් සියයට 11 ක පහළ වැටීමට සාපේක්ෂව බලන කල 1990 දී රුපියල් දශ ලක්ෂ 419 කින් හෙවත් සියයට 36 කින් ඉහළ නැගිණි. මෙම අංශයෙන් ආර්ථිකයේ ග්‍රාමීය අංශය වෙතට යොමු කළ බැංකු ණය ප්‍රමාණය වැඩිවීම මෙයට හේතු විය.

වසරේ අවසන් මාස කීපයේදී බැංකු ණය උපයෝජනය වේගවත්වීම හේතුවෙන්, රාජ්‍ය අංශයට ලබාදුන් ශුද්ධ ණය ප්‍රමාණය 1990 වසර තුළදී රුපියල් දශ ලක්ෂ 3,078 කින් හෙවත් සියයට 9 කින් ප්‍රසාරණය විය. වාණිජ බැංකු සතු භාණ්ඩාගාර බිල්පත් රුපියල් දශ ලක්ෂ 5,124 කින්ද, මහ බැංකුවේ තාවකාලික අත්තිකාරම් රුපියල් දශ ලක්ෂ 3,563 කින් ද ඉහළ නැගීම වසර තුළදී රජයේ බැංකු ණය වර්ධනයට දායක වූ ප්‍රධාන අයිතමයන් දෙක විය. කෙසේ වුවද, වර්ෂය තුළවූ රාජ්‍ය මූල්‍ය කටයුතු වලට ඇතුලත් කළ නොහැකි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට වූ වගකීම් ප්‍රතිප්‍රමාණය කිරීමේ ගැලපුමක් හේතුවෙන් පැන නැගුණු රුපියල් දශ ලක්ෂ 3,055 ක විශේෂ ණය ප්‍රමාණයක් ඉහත තාවකාලික අත්තිකාරම්හි ඇතුලත්ව ඇති බැවින්, රාජ්‍ය මූල්‍ය කටයුතු හේතුවෙන් පැන නැගුණු ශුද්ධ බැංකු ණය වර්ධනය ඉතා සුළු ලෙස සැළකිය හැක.

මේ අතර විදේශීය අංශයේ දක්නට ලැබුණු වර්ධනයන් 1990 වසරේ මුදල් සැපයුම මත ප්‍රසාරණාත්මක බලපෑමක් ඇතිකළ විශාලතම තනි අයිතමය ලෙස සැළකිය හැක. බැංකු ක්‍රමයේ ශුද්ධ විදේශ වත්කම් (ශු. වි. ව.) වල 1989 වසරේ වූ රුපියල් දශ ලක්ෂ 2,326 ක හෙවත් සියයට 33 ක පහත වැටීමට ප්‍රතිවිරුද්ධව 1990 වසරේදී රුපියල් දශ ලක්ෂ 5,474 ක හෙවත් සියයට 116 ක ඉහළ යාමක් දක්නට ලැබිණි. වර්ෂයේ පළමු කාර්තුව තුළ ශුද්ධ විදේශ වත්කම් කැපී පෙනෙන ලෙස ඉහළ නැගුණු අතර එය මාර්තු මස අවසානය වන විට දෙගුණයකින් පමණ එනම් රුපියල් දශ ලක්ෂ 9,342 ක් දක්වා වැඩි විය. කාලාන්තර උස්පහත් වීම් සහිත දෙසැම්බර් මස අවසානය වන විට එය රුපියල් දශ ලක්ෂ 10,206 ක් දක්වා තවදුරටත් වර්ධනය විය. යහපත් වූ ගෙවුම් ශේෂ තත්ත්වයත්, වැඩි ණය ප්‍රමාණයක් ලබා ගත හැකිවීමත් වර්ෂය තුළ බැංකු ක්‍රමය සතු විදේශ වත්කම් තත්ත්වයේ වර්ධනයට හේතු විය.

1990 වසර තුළදී වාණිජ බැංකුවල සමස්ත ද්‍රවශීල තත්ත්වය යහපත් අතට හැරිණි. ඉල්ලුම් තැන්පත් රුපියල් දශ ලක්ෂ 5,441 කින් වැඩිවූ අතර ද්‍රවශීල වත්කම් රුපියල් දශ ලක්ෂ 12,079 කින් ඉහළයාමේ හේතුවෙන්, 1989 අවසානයේදී 131 ක් වූ ද්‍රවශීල වත්කම් සඳහාවූ ඉල්ලුම් තැන්පත් අනුපාතය, 1990 අවසානයේදී 149 ක් දක්වා ඉහළ නැගිණි. ද්‍රවශීල වත්කම්වල වූ ප්‍රසාරණය, මූලික වශයෙන්ම වාණිජ බැංකු සතු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය වසර තුළදී රුපියල් දශ ලක්ෂ 5,124 කින් හෙවත් සියයට 84 කින් වැඩිවීමේ ප්‍රතිඵලයකි. වැඩිදියුණු වූ ගෙවුම් තුලන තත්ත්වයත්, මහ බැංකු ප්‍රතිමූල්‍ය ණයවල ප්‍රසාරණයත් යන කරුණු දෙකම වාණිජ බැංකු ක්‍රමයේ ද්‍රවශීලතාව ඉහළ නැංවීමට දායක වී ඇත. කෙසේ වුවද, වාණිජ බැංකු ක්‍රමයේ ද්‍රවශීලතා තත්ත්වය 1990 වසර තුළදී ඉහළ නැගුණු නමුදු, විශේෂයෙන් වසරේ අවසන් කාර්තු තුන තුළදී ඒක්ෂණ මුදල් වෙළෙඳපොලේ ගණුදෙනු ප්‍රමාණය, ලබා ගතහැකි සම්පත් ප්‍රමාණය සම්බන්ධයෙන් බැංකු අතර වූ අසමතුලිතතාව පිළිබිඹු කරමින් ඉහළ යාමේ උපනතියක් දක්වීය. මේ අතර ආර්ථික ක්‍රියාකාරකම් මට්ටමේ ඉහළ නැගීම, අඛණ්ඩව පැවති ඉහළ උද්ධමන අනුපාතික සහ විදුලිබල සහ ඉන්ධන මිළ ගණන්වල ඉහළ නැංවූ ප්‍රතිශෝධන හේතුකොටගෙන වැඩිවුනු කාරක ප්‍රාග්ධන අවශ්‍යතා යනාදියේ බලපෑම පිළිබිඹු

කරමින් පෞද්ගලික අංශයට ලබා දුන් වාණිජ බැංකු ණය වසර තුළදී රුපියල් දශ ලක්ෂ 14,465 කින් හෙවත් සියයට 22 කින් කැපී පෙනෙන ලෙස ඉහළ නැගිණි. 1989 වසරේදී මෙම වර්ධනය රුපියල් දශ ලක්ෂ 5,400 ක් හෙවත් සියයට 9 ක් විය.

වසර කීපයක් තුල සාමාන්‍ය ලෙස වර්ධනය වූ බැංකු ශාඛා පද්ධතියේ තියුණු ඉහළ යාමක් 1990 වසරේදී සනිටුහන් කරනු ලැබින. බැංකු ශාඛා ව්‍යාප්තිය සැළකිය යුතු ලෙස වැඩි කරමින් නව බැංකු ශාඛා 48 ක් වසර තුළදී විවෘත කෙරිණි. වාණිජ බැංකු විසින් පිහිටුවන ලද ශාඛා 30 ක් ද, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ශාඛා 11 ක් ද, ජාතික ඉතිරි කිරීමේ බැංකු ශාඛා 7 ක් ද මීට ඇතුළත් විය. බැංකු ශාඛා පද්ධතියේ වූ මෙම සැළකියයුතු ව්‍යාප්තිය, රටෙහි බොහෝ ප්‍රදේශ වල ආරක්ෂක තත්ත්වය යහපත් වීමත් සමඟම බැංකු පහසුකම් සැලසීමේලා බැංකු අතර ඇතිවූ තරඟය පිළිබිඹු කෙරිණි.

1990 වසර තුළදී මහ බැංකුවේ මුළු වත්කම්/වගකීම් රුපියල් දශ ලක්ෂ 14,692 ක හෙවත් සියයට 23 ක සාපේක්ෂ වශයෙන් කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කෙරිණ. වත්කම් අංශයෙන් බලන කල, විදේශීය මෙන්ම දේශීය වත්කම්වලද කැපී පෙනෙන වර්ධනයන් වාර්තා විය. මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතය (දළ) 1989 වසරේ වූ රුපියල් දශ ලක්ෂ 2,346 ක හෙවත් සියයට 31 ක වර්ධනයට අනුරූපව 1990 වසරේදී ද රුපියල් දශ ලක්ෂ 6,436 කින් හෙවත් සියයට 65 කින් විශාල ලෙස ඉහළ නැගිණි. මේ අතර මහ බැංකුවේ දේශීය වත්කම් ප්‍රමාණය (අනෙකුත් වත්කම් හා ගිණුම් ඉවත්කොට) 1989 වසරේ වූ රුපියල් දශ ලක්ෂ 761 ක හෙවත් සියයට 2 ක ඉතා සුළු වර්ධනය හා සැසඳීමේදී 1990 වසර තුළ රුපියල් දශ ලක්ෂ 4,483 කින් හෙවත් සියයට 11 කින් වැඩිවිය. ප්‍රධාන වශයෙන්ම වසර තුළදී වර්ධනය වූ කෙටි කාලීන ප්‍රතිමූල්‍ය ණය හේතුකොටගෙන රුපියල් දශ ලක්ෂ 3,018 කින් හෙවත් සියයට 70 කින් ඉහළ නැගුණු වාණිජ බැංකුවලට සහ අනිකුත් මූල්‍ය ආයතනවලට ලබාදුන් ණය සහ අත්තිකාරම් දේශීය වත්කම්වල කැපී පෙනෙන අයිතමය විය.

වගකීම් අංශයෙන් බලන කල, සංසරණයේ පවත්නා මුදල් සහ තැන්පතු වලින් සමන්විත මූල්‍ය වගකීම්, 1989 වසරේ වූ රුපියල් දශ ලක්ෂ 2,532 ක හෙවත් සියයට 7 ක වැඩිවීම සමඟ සසඳන කල 1990 දී රුපියල් දශ ලක්ෂ 11,661 කින් හෙවත් සියයට 32 කින් ඉහළ නැගිණි. සංසරණයේ පවත්නා මුදල්වල ඉහළයාම රුපියල් දශ ලක්ෂ 2,774 ක් වූ අතර තැන්පතු වගකීම්වල වර්ධනය රුපියල් දශ ලක්ෂ 8,887 ක් විය. මූල්‍ය වගකීම්වල දක්නට ලැබුණු කැපී පෙනෙන වර්ධනය 1990 වසරේ මූල්‍ය ක්‍රමය මත බලපැවැත්වූ පීඩනයන්හි පිළිබිඹුවකි. කෙසේ වුවද, විදේශීය කෙටිකාලීන ණය ගැණුම් මත වූ මහ බැංකුවේ නොපියවූ වගකීම්වල දක්නට ලැබුණු තියුණු පහත වැටීම කැපීපෙනෙන සතුටුදයක ප්‍රවණතාවකි. එබඳු ණය හැනීම්, 1989 වූ රුපියල් දශ ලක්ෂ 2,401 ක ඉහළ නැගීමට ප්‍රතිවිරුද්ධව 1990 වසරේ වූ වාසිදයක ගෙවුම් තුලන තත්ත්වය හමුවේ, රුපියල් දශ ලක්ෂ 2,631 කින් පහත වැටිණි.

දැඩි උද්ධමනාත්මක පීඩනයන් හමුවේ, 1990 වසරේදී දෙවන අඛණ්ඩ වසරටත් සාමාන්‍ය පොළී අනුපාතිකයන් තවදුරටත් ඉහළ මට්ටමක පැවතිණි. භාණ්ඩාගාර බිල්පත් නිකුත්කිරීම් මාර්ගයෙන් රජයට අරමුදල් සපයා ගැනීමේ උත්සාහයන් පිළිබිඹු කරමින් ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොලේ පොළී අනුපාතිකයන් ඉහළ මට්ටමක පැවති අතර එය වසර අවසානයේදී වසරකට සියයට 17.4 සිට සියයට 18.4 ක පරාසයක් තුළ පැවතිණි. සාමාන්‍යයෙන්, ද්විතීයික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොලේ පොළී අනුපාතික, ප්‍රාථමික බිල්පත් වෙළෙඳපොලේ පොළී අනුපාතිකයන්හි උච්චාවචන වලට ප්‍රතිචාර දක්වනු ලැබින.

භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොලේ පොළී අනුපාතිකයන්හි දක්නට ලැබුණු මධ්‍යස්ථ උච්චාවචනයන්ට ප්‍රතිවිරුද්ධව, ඒක්ෂණ මුදල් වෙළෙඳපොලේ අනුපාතයන්හි විශාල වෙනස්වීම් වසර තුළ දක්නට ලැබිණි. මෙය, මෙම මුදල් වෙළෙඳපොලවල් දෙක අතර සාපේක්ෂ වශයෙන් අඩු මට්ටමක පැවති සම්බන්ධතාවය පිළිබිඹු කරයි. වානිජ බැංකුවල එක් වසරක්

සඳහා වූ ස්ථාවර තැන්පතුවල අවම සහ උපරිම අනුපාතිකයන් 1989 වසර අවසානයේ සියයට 11·0–20·5 අතර පරාසයක පැවති අතර, එය 1990 වසර අවසානයේදී සියයට 11·0–21·0 අතර පැවතිණි. මෙම පුළුල් පරාසය ඇතුලත අනුපාතිකයන්ගේ සාමාන්‍ය ඉහළ නැගීම වසර තුලදී දක්නට ලැබිණි. මෙම වෙනස්වීම්වලට ප්‍රතිචාර වශයෙන් ජාතික ඉතිරි කිරීමේ බැංකුව (ජා. ඉ. බැ.) සිය තරඟකාරිත්වය රැකගැනීමේ අරමුණින් ඉතුරුම් සහ ස්ථාවර තැන්පතු සඳහා වූ පොළී අනුපාතික 1990 ජූලි මස ප්‍රතිශත අංක 2 කින් ඉහළ දමනු ලැබිණි. මේ අතර තැන්පතු පොළී අනුපාතිකයන්ගේ චලනයන්ට අනුව යමින්, වාණිජ බැංකුවල බර තබන ලද ප්‍රමුඛ ණයදීමේ අනුපාතිකය දෙසැම්බර් මසදී සියයට 18.6 දක්වා එම වසර තුළ වූ ඉහළම මට්ටම කරා ඉහළ නැගිණි.

1990 මැයි මාසයේදී මහ බැංකුව විසින් භාණ්ඩාගාර තැන්පතු සහතික පත්‍ර නිකුත් කිරීම ප්‍රකාශයට පත් කරන ලදී. මේවායේ ඵලදා අනුපාතිකය 1990 මැයි මස වසරකට සියයට 14·6–16·5 අන්තරයක සිට 1990 ඔක්තෝබර් මස වසරකට සියයට 17·1–19·0 අතර පරාසයක් දක්වා ඉහළ නැගුණ අතර වසරේ ඉතිරි කාලසීමාව තුළ එම මට්ටමේම පැවතිණි. වසර තුළ වූ කෙටි කාලීන අනුපාතිකයන්හි වෙනස්වීම් පිළිබිඹු කරමින් දිගුකාලීන පොළී අනුපාතිකයන් ද සුළු වශයෙන් ඉහළයාමේ උපනතියක් දැක්වීය. නිදසුනක් සේ, රජයේ සුරැකුම්පත් සඳහා වූ පොළී අනුපාතිකය වසරකට සියයට 11–12 අතර පරාසයක සිට වසරකට සියයට 13 දක්වා ඉහළ නැගුණු අතර මධ්‍යම හා දිගුකාලීන ණය අරමුදල යටතේ සමහර කාණ්ඩයන් සඳහා සපයන ලද ණය සඳහා වූ පොළී අනුපාතිකයන්හි ද සුළු ඉහළ යාමක් දක්නට ලැබිණි. ජාතික සංවර්ධන බැංකුව සහ ලංකා සංවර්ධන මූල්‍ය සමායතනය වැනි දිගුකාලීන ණය සැපයුම් ආයතනවල ණය දීමේ අනුපාතිකයන්ද වසර තුළදී සුළු වශයෙන් ඉහළ නැගිණි.

ප්‍රසාරණය වෙමින් පැවති ද්‍රවශීලතාව සහ අඛන්ඩව පැවති උද්ධමනාත්මක පීඩනයන් සහිත පසුබිමක් තුළ, 1990 වසර පුරාම දැඩි මූල්‍ය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මකව පැවතිණි. 1989 දී වර්ධනය වෙමින් පැවති උද්ධමනාත්මක පීඩනයන් සහ ගෙවුම් තුලන දුෂ්කරතා මධ්‍යයේ මූල්‍ය ප්‍රතිපත්තිය වඩාත් සීමාකාරී එකක් බවට පත්විය. බැංකු අනුපාතිකය සියයට 10 සිට සියයට 14 දක්වා ප්‍රතිශෝධනය කිරීම, වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට දෙන ලද ණය සඳහා ආංශික සීමාවන් පැනවීම, අත්‍යවශ්‍ය නොවන ආනයන සඳහා වූ ණයවර ලිපි මත සියයට 100 ක ආන්තික අවශ්‍යතා නියම කිරීම සහ භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොලේ කටයුතු තවදුරටත් දැඩි කිරීම එම වසරේ ක්‍රියාත්මක කරන ලද මූල්‍ය ප්‍රතිපත්ති අතර විය. 1990 වසරේදී මෙම සීමාකාරී මූල්‍ය ප්‍රතිපත්තිය තවදුරටත් දැඩි කරන ලදී. පළමුව, බැංකු අනුපාතිකය 1990 ජූලි මාසයේදී ප්‍රතිශත අංක 1 කින් සියයට 15 ක් දක්වා ඉහළ නැංවිණි. දෙවනුව, විවිධ පහසුකම් ගණනාවක් සඳහා වූ මහ බැංකු ප්‍රතිමූල්‍යවලට අදල පොළී අනුපාතික වසර තුළදී ඉහළ නැංවිණි.

මේ අතර, ආර්ථිකයේ අධි ද්‍රවශීලතාවක් ඇතිවීමට ප්‍රධාන සාධකයක් වූ සිය දේශීය වත්කම්වල වර්ධන අනුපාතය මධ්‍යස්ථ ලෙස පවත්වාගැනීමේ අරමුණින්, මහ බැංකුව විවට වෙළෙඳපොළ කටයුතු තවදුරටත් වේගවත් කරන ලදී. කෙසේ වුවද, ආර්ථික ක්‍රියාකාරකම්හි වේගවත් බව පවත්වා ගැනීම පිණිස, ආර්ථිකයේ අත්‍යවශ්‍ය සහ මූලික අංශ සඳහා ප්‍රතිමූල්‍ය පහසුකම් ලබාදීම තවදුරටත් කරගෙන යාම මහ බැංකුවේ වගකීමක් විය. මේ සඳහා, මධ්‍යම සහ දිගුකාලීන ණය අරමුදල (ම. දි. ණ. අ.) යටතේ ලබාගත හැකි සම්පත් ප්‍රමාණය 1990 ජුනි මස රුපියල් දශ ලක්ෂ 625 කින්ද, 1990 ඔක්තෝබර් මස තවත් රුපියල් දශ ලක්ෂ 750 කින්ද ඉහළ නංවන ලද අතර වසර අවසානයේදී එය රුපියල් දශ ලක්ෂ 3,250 ක් ව පැවතිණි.

පොදුවේ ගත්කල, භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොලේ පොළී අනුපාතිකයන් වෙළෙඳපොල තත්ත්වයන් මත තීරණය වන්නට ඉඩ හරින ලදී. වාණිජ බැංකුවල සහ අනිකුත් ආයෝජකයන්ගේ ද්‍රවශීල අරමුදල් සඳහා නිරන්තර ආයෝජන අවස්ථා සලසා දෙමින්

භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ ප්‍රාථමික වෙළෙඳපොලේ සතිපතා වෙන්දේසි පැවැත්විණි. විවිධ කල්පිරීම් සහිත එනම්, මාස 3 ක්, මාස 6 ක් සහ මාස 12 ක් ආදී වශයෙන් භාණ්ඩාගාර බිල්පත් ලබාගත හැකිවීම මගින් ආයෝජකයන්ට වඩා යහපත් ආයෝජන සංයුතිය තෝරා ගැනීම සඳහා විවිධ වූ ආයෝජන ඉඩ ප්‍රස්ථා සලසා දෙනු ලැබිනි. 1990 වසරේදී " ටැප් ක්‍රමය " යටතේ භාණ්ඩාගාර බිල්පත් විකිණීම, කොළඹ සිටින ආයෝජකයන් සඳහා ද විවෘත කරමින් තවදුරටත් පුළුල් කරන ලදී. ද්විතීයික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොලේ කටයුතු මගින්, විශේෂයෙන් මූල්‍ය ආයතනවල කෙටිකාලීන අතිරික්ත අරමුදල් සඳහා ආයෝජන අවස්ථා සලසා දෙනු ලැබිනි. වසර තුළදී මෙම භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොලේ විකුණුම් රුපියල් බිලියන 67.2 ක් ද මිළදී ගැනීම් රුපියල් බිලියන 21.1 ක් ද වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස මුළු දළ පිරිවැටුම රුපියල් බිලියන 88.3 ක් විය.

ප්‍රාථමික වෙළෙඳපොලේ සහ ද්විතීයික වෙළෙඳපොලේ කාර්‍යක්ෂම ක්‍රියාකාරිත්වයට ප්‍රතිචාර වශයෙන් බැංකු නොවන අංශය සතු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය 1989 දී රුපියල් බිලියන 15.5 සිට 1990 අවසානය වන විට රුපියල් බිලියන 22.9 ක් දක්වා ඉහළ නැගිණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මුළු නොපියවූ භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණයෙන් බැංකු නොවන අංශයේ කොටස මෙම වසර දෙක තුළ සියයට 31 සිට සියයට 37 දක්වා ඉහළ නැගිණි. මේ අතර, මුළු භාණ්ඩාගාර බිල්පත් නිකුතුව රුපියල් බිලියන 10.4 (නාමික අගය) කින් වර්ධනය වී තිබියදීත් මුළු බිල්පත් වලින් මහ බැංකුව සතු කොටස සියයට 57 සිට සියයට 44 දක්වා මෙම කාලසීමාවන් දෙක අතර පහත වැටිනි. විවට වෙළෙඳ කටයුතු කෙතරම් කාර්‍ය සාධකදැයි මෙතුළින් පිළිබිඹු වේ.

ශ්‍රී ලංකාව සිය ආර්ථික ක්‍රියාකාරිත්වය වඩා යහපත් කරලීම පිණිස, 1988 දී ජාත්‍යන්තර ආයතනයන්ගේ ආධාර ඇතිව තුන් අවුරුදු ව්‍යුහාත්මක වැඩ සටහනක් දියත් කරනු ලැබීය. ක්‍රියාත්මක වෙමින් පවතින ගැලපුම් ප්‍රයත්නයන් වර්ධනය කිරීම හා ශක්තිමත් කිරීම සහ මිල හා ගෙවුම් ශේෂ ස්ථාවරත්වය සහිත අඛණ්ඩ ආර්ථික වර්ධනයක් පවත්වා ගැනීමට අවශ්‍ය ස්ථිර අඩිතාලමක් ගොඩනැගීමේ අරමුණු ඇතිව 1990 ත් ඇරඹුණු තුන්වන වසර වැඩ සටහන සැළසුම් කරනු ලැබිණි. 1990 දී ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ පුළුල් ක්ෂේත්‍රයක් ආවරණය කරන ලදී. රාජ්‍ය වියදම් තාර්කික කිරීම පිණිස රජය තිරිඟු පිටි, සහල් සහ පොහොර සඳහා දෙන ලද සහනාධාර ඉවත් කරන ලද අතර මින් ඇතිවූ අයවැය ඉතිරිය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1 ක් පමණ විය. රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යවසායයන් කීපයක්ම ජනතාකරණය කරන ලදී. තවද ගාස්තු ප්‍රතිශෝධනය කිරීම මගින් ගමනාගමන අංශය වෙනුවෙන් අයවැයෙන් දැරූ වගකීම අඩුකර ගැනීමෙහිලා සැළකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කරනු ලැබිණි. වඩා යහපත් ඉලක්කයන් පවත්වා ගැනීම තුළින් ජනසවිය, දිවා ආහාර වැඩ පිළිවෙල ආදිය සඳහා කරන ලද සුභසාධක වියදම් හසුරුවා ගතහැකි මට්ටමක රඳවා ගනු ලැබිණි. ව්‍යාපාරික වාතාවරණය යහපත් කිරීම සහ පෞද්ගලික අංශයේ විශ්වාසය තහවුරු කිරීමේ අරමුණින් යුතුව, විශේෂිත අංශ කීපයක හැර අනෙකුත් අංශවල විදේශීය ප්‍රාග්ධන සහභාගිත්වය සඳහා තිබූ සීමාවන් ඉවත් කරන ලද අතර විදේශිකයන් විසින් කොටස් ගණුදෙනු කිරීමේදී ගෙවිය යුතු වූ සියයට 100 යේ පැවරුම් බද්දද අහෝසි කරන ලදී. නිදහස් වෙළෙඳාම හා අදළව තැබූ තවත් පියවරක් වශයෙන් රටෙහි තීරුබදු ක්‍රමය සරල කරනලද අතර, උපරිම නාමික තීරුබදු අනුපාතය සියයට 50 දක්වා පහත හෙලන ලදී.

මෙම ප්‍රතිපත්තිමය දිරිගැන්වීම්වලට ආර්ථිකය ඉතාමත් සතුටුදායක ලෙසින් ප්‍රතික්‍රියා දක්වනු ලැබිනි. පස් වසරක් පුරා පැවති මධ්‍යස්ථ ක්‍රියාකාරිත්වයකින් අනතුරුව මූර්ත දළ ජාතික නිෂ්පාදනයෙහි වර්ධනය සියයට 6.6 දක්වා වේගවත් විය. රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරිත්වය තවදුරටත් ශක්තිමත් කරමින්, අයවැය හිඟය/දළ දේශීය නිෂ්පාදන අනුපාතය 1989 දී සියයට 11.2 සිට 1990 දී සියයට 9.9 දක්වා පහත වැටිණි. වඩා අඩු මට්ටමක ජංගම ගිණුමේ හිඟයක් හා වි. ගැ. හි. දශ ලක්ෂ 130 ක අතිරික්තයක් සහිත සමස්ත ශේෂයක් පෙන්නුම් කරමින්

ගෙවුම් ශේෂය සැළකිය යුතු ක්‍රියාශීලිත්වයක් විදහා දක්වනු ලැබිණි. මෙම ජයග්‍රහනයන් අත්කර ගැනීමේදී පැවති තත්ත්වයන් හා සළකා බලන කල මේවා ඉතා බැරෑරුම් කාර්යයන් සේ සැළකිය හැක. මෙම සතුටුදයක සංවර්ධනයන් මධ්‍යයෙහි යම් යම් අයහපත් උපනතීන්ද දක්නට ලැබුණු අතර ඒවා නිසි පියවර නොගෙන දිගින් දිගටම පැවත යාමට ඉඩ හරිනු ලැබුවහොත් අනාගත වර්ධනය හා ආර්ථික ක්‍රියාකාරිත්වය උවදුරෙහි හෙළනු ලැබිය හැකිය. වඩාත්ම බැරෑරුම් තත්ත්වය වූයේ ආර්ථිකය තුළ නොනැවතී පැවතුන උද්ධමනකාරී පීඩනයයි. 1990 වර්ෂයෙහි වැඩි කාලයක් තුළ, මිළ ගණන් වැඩිවීම ඉතා තියුණු වූ අතර කොළඹ පාරිභෝගිකයන්ගේ මිළ දර්ශකයට අනුව උද්ධමන අනුපාතිකය සියයට 21 කට ආසන්නව පැවතුණි. උද්ධමනකාරී පීඩනයන්හි ඇතිවූ යළි නැගී සිටීම, ආර්ථික කළමනාකරණයෙහිලා අත්කර ගන්නා ලද යහපත් ප්‍රතිඵල යටපත් කිරීමට හා ඉදිරි වර්ෂවලදී සාධාරණ මිළ ස්ථායීතාවයක් සහිතව ශක්තිමත් වර්ධන ක්‍රියාකාරිත්වයක් අත්කර ගැනීම සඳහා වූ අපේක්ෂාවන්ට අනතුරු කිරීමක් කරනු ලැබිය හැකිය. පාලනය නොකරන ලද උද්ධමනයට, ආර්ථිකය යථා තත්ත්වයට පත්කර ගැනීම පිළිබඳ දුෂ්කර කාර්යයට ආධාරකයක්ව පවතින විශ්වාසනීයත්වය බිඳ දැමිය හැකි අතර රටට ඉතා බලවත් ලෙස අවශ්‍යව පවතින විදේශීය ආයෝජන ගලාඒම ඉවතට ඇදීයාමේ අවදනමක්ද ඇති කළ හැකි බව අමුතුවෙන් සඳහන් කළයුතු නැත.

උද්ධමනයට ආර්ථිකය හා ආර්ථික ක්‍රියාකාරිත්වය කෙරෙහි විවිධ ආකාරයෙන් බලපෑ හැක. පළමුව, එය මිළ ව්‍යුහය විකෘති කරනු ලබන අතර එම තත්ත්වය ආර්ථිකයේ තරඟකාරී අවශ්‍යතාවයන් අතර සම්පත් බෙදහැරීම කෙරෙහි අයහපත් ලෙසින් බලපානු ලබයි. දෙවනුව, උද්ධමනයට මූල්‍ය වත්කම්හි මූර්ත අගය හීන කිරීම තුළින් මූල්‍ය අතරමැදි ක්‍රියාවලිය දරුණු ලෙස පීඩාවට පත් කළ හැක. මෙම තත්ත්වය, සකසුරුවම් සහිත සහ මුදල් ඉතුරු කරන පුද්ගලයන් හට ලාභ රහිත තත්ත්වයක් උද කරවන අතර ණය අරමුදල් මත යැපෙන්නන්ට වාසි අත්කර දෙනු ලැබේ. තුන්වනුව, දිගින් දිගටම පවත්නා උද්ධමනය නිසා අපනයන තරඟකාරිත්වය පීඩාවට පත්විය හැකි අතර ආනයන ගලාඒම දිරිගන්වයි. මෙබඳු ක්‍රියාදමයක්, විනිමය අනුපාතිකය හා ජාත්‍යන්තර සංචිත කෙරෙහි අයහපත් ප්‍රතිඵල ඇති කරවමින් රටෙහි ගෙවුම් ශේෂය කෙරෙහි දැඩි පීඩනයක් ඇති කරලීමට සමත් වේ. හතරවනුව, නොනැවතී පවතින උද්ධමනය විදේශීය ප්‍රාග්ධන ගලාඒම අධෛර්‍යමත් කරන අතර ප්‍රාග්ධනය රටින් පිටට ගලායාම දිරිගන්වනු ලැබිය හැකිය. මෙවැනි ක්‍රියාවලියක් ප්‍රාග්ධන ඌනතාවයක් ඇති ආර්ථිකයකට ව්‍යසනකාරී වේ. පස්වනුව, උද්ධමනකාරී කාලවල රජයේ ආදායමට වඩා රජයේ වියදමෙහි වේගවත් වැඩිවීම තුළින් ඇතිවන පාලනය කළ නොහැකි අයවැය හිඟයන් දක්නට ලැබෙන අතර, එම හිඟයන් ප්‍රසාරණාත්මක ප්‍රභවයන්ගෙන් පියවා ගනු ලැබුවහොත් උද්ධමනය තවදුරටත් තීව්‍ර වේ. සයවනුව, ජීවන වියදමෙහි සීඝ්‍ර ඉහළ නැඟීම නිසා ඇතිවන වැඩි වැටුප් ඉල්ලීම්වලට විරෝධය පෑමට සේවායෝජකයන්ට දුෂ්කර වන අතර මෙබඳු තත්ත්වයන් වැටුප්-මිළ දඟරයකට හේතු වේ. හත්වනුව, උද්ධමනකාරී තත්ත්වයක් යටතේ සාපේක්ෂ මිළ ගණන්හි සහ පොළී අනුපාතිකයන්හි පවතින අවිනිශ්චිතභාවය සහ අස්ථායීතාවය, දිගුකාලීන ආයෝජන සඳහා මුදල් යෙදවීම අවදනම් සහ දුෂ්කර කර්තව්‍යයක් බවට පත්කරනු ලබයි.

උද්ධමනයේ ඇති ඉතාම බාධාකාරී අංගය එහි ඇති අයහපත් සමාජීය ප්‍රතිඵලයි. සාමාන්‍ය නියමයක් ලෙස, උද්ධමනයේ ඇති අයහපත් ප්‍රතිඵල අසමානව බෙදී යයි. වඩා ධනවත් සහ එම අයහපත් වර්ධනයන්ට මුහුණ පෑමට හැකියාවක් ඇති පුද්ගලයන් හා සළකා බලන කල සමාජයේ සිටින දුප්පත් හා වඩාත් දුර්වල කොටස් මෙම පීඩනයට වඩාත් ලක්වේ. වැටුප් වලට සමානුපාතික නොවන ලෙසින් ලාභ වැඩිවීම නිසා ඇත්තෙන්ම සමහරු මෙම උද්ධමනකාරී තත්ත්වයෙන් වාසි අත්කරගනු ලබයි. ශ්‍රී ලංකාවෙහි ජනගහනයෙන් සැළකිය යුතු කොටසක් තවමත් දිළිඳුභාවයේ පසුවෙති. මේ අනුව, මෑත කාලයේදී, රජයේ ආර්ථික ප්‍රතිපත්තියෙන් දිළිඳුකම දුරලීම අරමුණු කරගත් වැඩසටහන්වලට ඉහලම ප්‍රමුඛස්ථානය ලැබිණි.

කෘෂිකර්මාන්ත, කර්මාන්ත සහ අනෙකුත් අංශවල ප්‍රමාණවත් වර්ධනයක් සහ සාමාන්‍ය ඵලදායී සේවා නියුක්තියක් ඇතිවන තුරු වඩා පීඩාවට පත් කොටස් ආරක්ෂා කිරීම පිණිස, ලබාගත හැකි සම්පත් ප්‍රමාණයන්හි සීමාවන්ට යටත්ව, ඉතා හොඳින් ඉලක්ක කරන ලද, දිළිඳුකම දුරලීමේ වැඩසටහන් සැළසුම් කරනු ලැබිණි. දිගින් දිගටම පවත්නා හා පාලනය නොකරන ලද උද්ධමනය දුප්පත්කමට එරෙහිව දැඩි පරිශ්‍රමයකින් ලබාගත් යහපත් ප්‍රතිඵල තුරන් කරනවා පමණක් නොව, එම වැඩසටහන් ඒවායේ සැළසුම් මඟින් ඉවතට ඇද දැමිය හැක.

ආර්ථිකය තුළ මිළ පීඩනය පවත්වාගෙන යාමට විවිධ සාධක දයක වූ අතර මූල්‍ය සමස්තයන්ගේ වර්ධනය තුලින් නිරූපනය කරන ලද සමස්ත ඉල්ලුමෙහි ඉහළ මට්ටම, 1990 දී පැවති උද්ධමනකාරී පීඩනයට සුළු පටු නොවන ලෙසින් දයක විණි. මහ බැංකුවෙන් දෙනු ලැබූ ප්‍රතිමූල්‍ය ණයද ආංශික වශයෙන් හේතුවෙමින් වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට දෙන ලද ණය ප්‍රමාණයෙහි ඇතිවූ අධිකතර වර්ධනය, සමස්ත ඉල්ලුම ඉහළ මට්ටමක පැවතීමට හේතුවිය. සමස්ත ඉල්ලුමේ මෙම ඉහළ මට්ටම, සැපයුම් තත්ත්වයන්ට සරිලන ප්‍රමාණයට වඩා බෙහෙවින් වැඩි විය. 1989 දී සියයට 9 කින් ඉහළ නැඟුන වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට දෙන ලද ණය ප්‍රමාණය 1990 දී සියයට 22 කින් ඉහළ නැඟුන අතර, ආර්ථිකයෙහි ඉල්ලුම් පීඩනය ලිහිල් කිරීම පිණිස මූල්‍ය ප්‍රතිපත්තිය තවදුරටත් දැඩිකිරීමේ පැහැදිලි අවශ්‍යතාවයක් වර්ෂය අවසානය වන විට දක්නට ලැබින. මෙම විශේෂිත උද්ධමන අනුපාතිකය මධ්‍ය කාලයන් තුල අඩු කිරීම පිණිස මුදල් සැපයුමෙහි සාමාන්‍ය වර්ධන වේගය සැළකියයුතු ප්‍රමාණයකින් අඩුකළ යුතුය. මේ සඳහා බැංකු ණය හා මහ බැංකු ප්‍රතිමූල්‍ය ණය වර්ධනය සැළකියයුතු අන්දමින් මැඩපැවැත්වීම අවශ්‍යයෙන්ම කළ යුතු වේ.

විශේෂයෙන්ම, අනවශ්‍ය දැඩි බරක් මූල්‍ය ප්‍රතිපත්තිය මත පැටවූකල උද්ධමනය පාලනය කිරීම පහසු කාර්යයක් නොවන බව වටහාගත යුතුය. දැඩි මූල්‍ය ප්‍රතිපත්තියක් සෑහෙන තරම් දිගු කාලයක් පවතී නම්, එය උද්ධමනය ලිහිල් කිරීමට දයක විය හැකි නමුත්, එහි අතුරු විපාක මූලික තත්ත්වයේදී මෙන්ම අයහපත් විය හැක. සම්පත් කාර්‍යක්ෂම ලෙස බෙදහැරීම සළකා බලන කල, මූල්‍ය ප්‍රතිපත්තිය විශාල වශයෙන් වෙළෙඳපොල පදනම් වූ මූල්‍ය උපකරණ මත රඳාපැවතියයුතු යයි පිළිගැනේ. එහෙත් ලංකාවේ මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳපොල තවමත් හැඩගැසෙමින් පවතින බැවින් සහ එම වෙළෙඳපොල තුළ පවතින විකෘති තත්ත්වයන් හේතුකොටගෙන වෙළෙඳපොල පදනම් වූ මූල්‍ය උපකරණ සාර්ථක ලෙස ක්‍රියාවේ යෙදවීමට ඇති අවස්ථාවන් සීමාසහිත වේ. එමනිසා මූල්‍ය පාලනය සඳහා ඍජු හා වක්‍ර උපකරණයන් දෙවර්ගයම යොදගැනීමේ ක්‍රමය තවදුරටත් අනුගමනය කළ යුතුය. ශ්‍රී ලංකාවේ වර්තමාන සංවර්ධන මට්ටම යටතේ වෙළෙඳපොල පදනම් වූ මූල්‍ය උපකරණ මත අධික ලෙස රඳාපැවැත්මද ගැටළු සහිතවේ. උදහරණයක් ලෙස, ආයෝජනය හා නිෂ්පාදනය සඳහා දෙන දිරිගැන්වීම්වලට බාධා නොකරන්නේනම් පොළී අනුපාත ප්‍රතිපත්ති හා අදළ ක්ෂේත්‍රයෙහි ක්‍රියාත්මක වීමට ඇති නිදහස සෑහෙන දුරකට සීමාවේ. ව්‍යවසායකයන් සාමාන්‍යයෙන් ලාභදයී ණය බලාපොරොත්තුවන අතර, ඉහළ උද්ධමන අවස්ථාවකදී වුවද පොළී අනුපාත ඉහළ යයි නම් සිය අප්‍රසාදය පළකරයි. පොළී අනුපාතික ඉහළ නගින උපනතියක් පවත්නා අවධියක්, සාමාන්‍යයෙන් ආර්ථික කටයුතුවල පහත වැටීමක් හෝ ආර්ථික පසුබැස්මක් ඇතිවන කාලයකට අවතීරණය වීමක් ලෙස හඳුනා ගත හැක. අළුත් රැකියා විශාල සංඛ්‍යාවක් බිහිකිරීමේ අවස්ථාව උදකරමින් ව්‍යාපාරික වාතාවරණය දියුණු වෙමින් පවතින අවස්ථාවලදී මෙය විශේෂයෙන්ම වැදගත් වේ. අනෙක් අතට, උද්ධමනාත්මක කාලවලදී අනිවාර්යයෙන් සිදුවන පරිදි, මූල්‍ය වත්කම්වල ප්‍රාග්ධනමය වටිනාකම පිරිහීම වලක්වා, ඉතුරුම් සුරක්ෂිතකර ගැනීම පොදු තැන්පත්කරුවන්ගේ අවශ්‍යතාවය වියහැක. උද්ධමනකාරී අවස්ථාවකදී මෙම ද්විධාකරණ ගැටළුව විසඳමින් දුෂ්කරවූ සමතුලිතයක් පවත්වාගෙන යාම ප්‍රතිපත්ති සම්පාදකයන් මුහුණ දෙන ප්‍රධාන අභියෝගයකි. ව්‍යාපාරික විශ්වාසනීයත්වය හා අපනයන තරඟකාරිත්වය බිඳ වැටිය හැකි ඉතාමත් ඉහළ උද්ධමන අනුපාතිකයකට වඩා තාවකාලිකව ඉහළ මට්ටමක පවතින පොළී අනුපාතිකයන් යහපත් බව, සාමාන්‍ය මහජනතාවට සහ විශේෂයෙන්ම

ව්‍යවසායක පංතියට ඒක්තු ගැන්විය යුතු ය. එමනිසා අවශ්‍ය ප්‍රමාණයට මූල්‍ය ස්ථායිතාවය ලභාකරගැනීම සඳහා මූල්‍ය ප්‍රතිපත්ති ඥනාන්විත ලෙස භාවිතා කළ යුතු අතර, ප්‍රමාණවත් නිෂ්පාදන දිරිගැන්වීමද පවත්වාගෙන යායුතුය. වෙනත් වචනවලින් කියතොත්, වර්ධන ක්‍රියාවලිය අවශ්‍ය ප්‍රමාණයට වඩා වේගවත් වීමට ඉඩහැර ආර්ථිකය අධි පීඩනයකට ලක් නොකළ යුතු අතර එම ක්‍රියාවලියට අනිසි ලෙස අවහිර කරමින් ආර්ථික කටයුතු සීමා කිරීමද කළයුතු නොවේ. 1990 අවසානය වන විට ඉමහත් වැදගත් කමක් පෙන්වූ ප්‍රතිපත්තිමය අභියෝගය මෙය විය.